සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 13 - 2023**

# බෞද්ධ ශිෂ්ටාචාරය - II

**කාලය පැය 03 යි**

නම/ විභාග අංකයඃ

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනිමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදවන්න.

**උපදෙස් -**

- I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකයට ම ලකුණු 20 බැගින් හිමි වේ.

## I කොටස

1. (i) වානප්‍රස්ථ ආශ්‍රමයට අයත් කාර්යයන් **හතරක්** නම් කරන්න. (ලකුණු 2යි)
   (ii) බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ **තුනක්** පෙන්වා දෙන්න. (ලකුණු 3යි)
   (iii) බුදු සමය මානව සංහතියේ ඒකත්වය සනාථ කිරීමට ඉදිරිපත්කරන ඉගැන්වීම් **හතරක්** මූලශ්‍රයාගත ව ඉදිරිපත් කරන්න. (ලකුණු 4යි)
   (iv) බුදුරදුන් දවස භාරතීය සමාජය වාණිජකරණයට ලක්ව පැවැති බව **සාධක** පහක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 5යි)
   (v) නිගණ්ඨනාථපුත්තතුමන්ගේ ඉගැන්වීම් බුදු දහමින් විචාරයට ලක්වන අයුරු විස්තර කරන්න. (ලකුණු 6යි)

2. (i) බුදුරජාණන් වහන්සේ **"බුද්ධ"** නාමයෙන් හැඳින්වීමට හේතු වූ සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 2යි)
   (ii) බුදුරජාණන් වහන්සේගේ මහා කාරුණිකත්වය නිදසුන් **තුනක්** මගින් පැහැදිලි කරන්න (ලකුණු 3යි)
   (iii) ආදර්ශවත් ශ්‍රාවක සමාජයක් නිර්මාණය කරගැනීමෙහිලා තාදී බුදු ගුණය ඉවහල්වන අයුරු නිදසුන් **හතරක්** ඇසුරෙන් පෙන්වා පෙන්වා දෙන්න (ලකුණු 4යි)
   (iv) සැරියුත් තෙරුන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ **හතරක්** සැකවින් ඉදිරිපත් කරන්න (ලකුණු 5යි)
   (v) බුද්ධ කාලීන ධර්මදූතයන් වහන්සේලාගේ කාර්ය සාඵල්‍ය ඇගයීමට ලක්කරන්න. (ලකුණු 6යි)

3. (i) "සුකරානි අසාධූනි" යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 2යි)
   (ii) එම ගාථාවේ අර්ථය නිවරැදි ව ලියන්න. (ලකුණු 3යි)
   (iii) ස්වාමි සේවක සම්බන්ධතාවට අදාළ යුතුකම් හා වගකීම් දහය සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න. (ලකුණු 4යි)
   (iv) මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව සූත්‍රානුසාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5යි)
   (v) භාරතීය බෞද්ධ අධ්‍යාපනයේ විශිෂ්ඨත්වය වළභි විශ්ව විද්‍යාල තුලින් ප්‍රකට කෙරෙන බව සනාථ කරන්න. (ලකුණු 6යි)

## `II කොටස

4. (i) බෞද්ධ දේශපාලන සංකල්ප මානව හිතවාදී පාලන තන්ත්‍රයක් ගොඩනගා ගැනීමට හේතු වන අයුරු විමසන්න. (ලකුණු 10යි)

   (ii) මෙලොව පරලොව උභයාර්ථ සාධනයට දස කුසල් උපකාරීවන අයුරු අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 10යි)

5. (i) පරිසර සංරක්ෂණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් වත්මන් පරිසර ගැටලු අවම කරගැනීමට ඉවහල්වන අයුරු පරීක්ෂා කරන්න. (ලකුණු 10යි)

   (ii) රටක ආර්ථික හා සමාජීය ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේදී ධනෝපායානය හා ධනපරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම්වල පවත්නා වැදගත්කම ඇගයීමට ලක්කරන්න. (ලකුණු 10යි)

6. (i) පළමු ධර්ම සංගායනාවට පදනම් වූ කරුණු සැකවින් දක්වා ශාසන චිරස්ථිතියට එහි ප්‍රතිඵල හේතු වූ අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

   (ii) ධර්මාශෝක අධිරාජයා බුදු සසුනේ උන්නතිය උදෙසා ගත් ක්‍රියාමාර්ග විමසීමට ලක් කරන්න. (ලකුණු 10යි)

7. (i) ථායි සංස්කෘතිය පෝෂණය කිරීමට බුදු දහමින් ලැබුණ දායකත්වය ඇගයීමට ලක්කරන්න. (ලකුණු 10යි)

   (ii) අභයගිරි විහාරයේ ප්‍රභවය මෙරට ආගමික හා සංස්කෘතික පරිවර්තනයක් උදාකරලීමට ඉවහල් වූ අයුරු විමර්ශනය කරන්න. (ලකුණු 10යි)

8. (i) භාරතීය බෞද්ධ ස්තූපයේ ප්‍රභවය පැහැදිලි කොට සාංචි ස්තූපයට සාපේක්ෂ ව ලාංකේය ස්තූපයේ වෙනස්කම් පෙන්වා දෙන්න. (ලකුණු 10යි)

   (ii) පහත සඳහන් මාතෘකා දෙකකට ප්‍රමාණවත් කෙටි සටහන් ලියන්න.

   (1). සඳකඩ පහණ

   (2). වාහල්කඩ

   (3). මහනුවර යුගයේ චිත්‍ර කලාව

   (4). කච්සිළුමිණ (ලකුණු 05x2 = 10 යි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 13 - 2023**

# බෞද්ධ ශිෂ්ටාචාරය - I

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

**උපදෙස්**

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1,2,3,4.5. යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එය සලකුණු කරන්න

01. දන්දීම, යාගකිරීම, ඉගෙනීම යන කාර්යයන් පැවැරී තිබුණේ
(1) බ්‍රාහ්මණයින්ට පමණි. (2) ක්ෂත්‍රියන්ට පමණි (3) වෛශ්‍යයන්ට පමණි
(4) බ්‍රාහ්මණ හා ක්ෂත්‍රියන්ට පමණි (5) බ්‍රාහ්මණ, ක්ෂත්‍රියන් හා වෛශ්‍යයන්ට පමණි

02 පහත සඳහන් ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශය දක්වෙනුයේ,
(1) බුදුරදුන් පහළවනවිට භාරතීය සමාජය පුරුෂාධිපත්‍යයෙන් යුක්ත විය.
(2) බෞද්ධ බ්‍රහ්මචර්යාව ජීවිතයේ එක් සමයකට පමණක් සීමා úh'
(3) යාගයේදී අධ්වර්යුගේ කාර්ය වනුයේ වේදපාඨ ගායනා කර යාගයට ආරාධනා කිරීමයි.
(4) යාගයේ ප්‍රතිලාභ කුලීන වර්ණයන්ට පමණක් සීමා නොවුණි.
(5) ගුණය හා කර්මය පදනම් ව මහා බ්‍රහ්ම විසින් වර්ණ ධර්ම ඇතිකළ බව මනුස්මෘතියේ සඳහන්වේ.

03. බුදුරජාණන් වහන්සේ කාන්තාවගේ නිදහස තහවුරුකරලීම සඳහා සිදුකළ ඉගැන්වීම් සමුදායක් සූත්‍රපිටකය තුළින් හඳුනාගත හැකි ය. ඒ ඉගැන්වීම් තුළින් කාන්තාවගේ විවිධ භූමිකාවන් ප්‍රකට කෙරෙන අතර එම භූමිකාවන් පවා ඇගයීමට ලක්වී ඇති බවක් දැකිය හැකි ය. ඒ අනුව සංයුක්ත නිකායේ සඳහන් ධීතු සූත්‍රය තුළින් නිරූපණය කෙරෙනුයේ,
(1) මවක් වශයෙන් කාන්තාව ලද නිදහස පිළිබඳවයි.
(2) බිරිඳක් වශයෙන් කාන්තාව ලද නිදහස පිළිබඳවයි.
(3) දියණියක් වශයෙන් කාන්තාව ලද නිදහස පිළිබඳවයි.
(4) උපාසිකාවක් වශයෙන් කාන්තාව ලද නිදහස පිළිබඳවයි.
(5) භික්ෂුණියක් වශයෙන් කාන්තාව ලද නිදහස පිළිබඳවයි.

04. බුද්ධ කාලයේ ශ්‍රමණ සම්ප්‍රදාය නියෝජනය කළ -------------- නම් වූ ශ්‍රමණ ගුරුකුලය සමාජයට ඉදිරිපත් කරනු ලැබුවේ ආත්මවාදයයි.
(1) ආජීවක (2) නිගණ්ඨ (3) තාපස . (4) පරිබ්‍රාජක (5) ජටිල

05. බුද්ධකාලීන ප්‍රකට ශාස්තෘවරුන් කිහිප දෙනෙකුගේ ආගමික හා දාර්ශනික මතවාද කිහිපයක් පහත දක්වේ.
**A** සත්වයාගේ කෙළෙසීමට හෝ විසුද්ධියට හේතු ප්‍රත්‍යයක් නොමැත
**B** පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ, ජීව යනුවෙන් ස්ථිර සප්ත පදාර්ථයක් ඇත.
**C** සියලු සත්ත්වයෝ අබලය, අවිරියය, ශක්ති නැත්තෝය.
**D** දුන් දෙයෙහි පල නැත, යාගයෙහි හෝ කුශලාකුශල කර්මයන්ගේ විපාක නැත.
**E** සියලු සැප දුක් පෙරකරන ලද කර්මයට අනුව සිදුවේ.
**F** ස්වභාව නියතියකට අනුව සත්වයාගේ සසර ගමන හා විමුක්තිය සිදුවේ.
ඉහත ප්‍රකාශ අතරින් මක්ඛලී ගෝසාලයන්ගේ ඉගැන්වීම් ඇතුළත් වරණය කුමක් ද?
(1) B, C සහ E වලය. (2) A, B සහ E වලය. (3) C, D සහ F වලය.
(4) A, C සහ F වලය. (5) C, D සහ E වලය.

06. බුදු රජාණන් වහන්සේ කළගුණ සැලකීමේ අගය වටහා දෙනු ලැබුවේ. .......................... රජතුමා අරබයා ය.
(1) බිම්බිසාර (2) කොසොල් (3) අජාසත්ත (4) චන්ඩපජ්ජෝත (5) උදේන

07. පහත සඳහන් ප්‍රකාශ කියවා නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ක්‍රි. පූ. 6 වන සියවසේ පෞර රාජ්‍ය බිඳවැටීම සොළොස්මහා ජනපද බිහිවීමට හේතු විය.
(2) බුදුරදුන් වෙනුවෙන් පිරිනැමුණ රාජකාරාමය පිහිටා තිබුණේ මගධ රාජ්‍යයේ ය.
(3) මහා කච්චායන හිමියන්ගෙන් ධර්මය අසා උදේන රජු බෞද්ධයෙකු වූ බව වාර්තාවේ.
(4) වීරකාව්‍ය යුගයේ කෝසලය දුර්වල රාජ්‍යයක් ව පැවතුන බව ඉතිහාසයේ සඳහන්වේ.
(5) බුදුරදුන් පස්වග තවුසන්ට දම්සක් පැවැතුම් සූත්‍රය දේශනා කරනු ලැබුවේ වජ්ජි රාජ්‍යයේදී ය.

08. කෘෂි කර්මාන්තය දැහැමි ජීවන මාර්ගයක් ලෙස අගය කරන බුදු සමය පාලකයා විසින් ගොවීන්ට අවශ්‍ය පහසුකම් සපයාදීමෙන් අනුග්‍රහ දැක්විය යුතු බව . .......................... සූත්‍රයේ දැක්වේ
(1) කූටදන්ත (2) අග්ගඤ්ඤ (3) කසීභාරද්වාජ (4) සාමඤ්ඤඵල (5) චක්කවත්තිසීහනාද

09 සිවු සස් සිය නැණින් - දැන දැන්වී ය කුලුණින්
දුරලයි අනුවණින් - .......................
යනාදී වශයෙන් දැක්වෙන මෙම පද්‍යයෙන් විස්තරවන බුදුගුණය කුමක් ද?
(1) බුද්ධ ගුණය (2) ලෝකවිදූ ගුණය (3) පුරිසදම්ම සාරථී ගුණය
(4) විජ්ජාචරණ ගුණය (5) භගවා ගුණය

10. පහත සඳහන් ප්‍රකාශන අතරින් බුදුරදුන්ගේ මහා කරුණාවට අදාළ ප්‍රකාශය කුමක් ද?
(1) කොසොල් රජතුමාගේ අසදෘස දානය පිළිගැනීම.
(2) සකුළුදායි පිරිවැජියාගේ අසපුවට වැඩම කිරීම.
(3) මට්ටකුණ්ඩලී වැතිර සිටි ස්ථානයෙන් වැඩම කිරීම.
(4) අන්තගාමී නොවී මැදිහත් පිළිවෙතක් අනුගමනය කිරීම
(5) උපාලි ගෘහපති ප්‍රත්‍රයාට විමසා කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දීම.

11. බුදුරජානන් වහන්සේ වරක් චම්පා නුවරට වැඩම කළපසු එගම නායක බමුණෙක් උන්වහන්සේ දැකීමට යාමට සූදානම් විය. ඔහුගේ සහචරයෝ ඒ ගමන වැළැක්වීමට විවිධ කතා කීහ. එහිදී බුදුරදුන්ගේ ගුණ කදම්බය වර්ණනා කළ නායක බමුණා සෙසු බමුණු පිරිස ද කැටිව බුදුරදුන් වෙත පැමිණියේ ය. එම බමුණා වූයේ .
(1) අග්ගිකභාරද්වාජ ය. (2) කසීභාරද්වාජ ය. (3) සෝණදණ්ඩ ය.
(4) අක්කෝසකභාරද්වාජ ය. (5) වාසෙට්ඨ ය

12. අනේපිඬු සිටුතුමන් සම්බුද්ධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් මහගු මෙහෙවරක් සිදුකළ බුදුරදුන්ගේ පවා ඇගයීමට ලක්වූ සැදැහවත් උපාසකයෙකි. එතුමන්ගේ ශාසනික සේවා ලැයිස්තුවට ඇතළත් නොවන්නේ මින් කුමක් ද?
(1) ජේතවන විහාරය ඉදිකොට බුදු සසුනට පූජා කිරීම වෙනුවෙන් කහවනු පනස් හතර කෝටියක් වැය කිරීම
(2) අනේපිඬු සිටුතුමන්ගේ සේවිකාවන වූ කුජ්ජුත්තරා දාසි බවින් නිදහස් කිරීම.
(3) තම පුත් "කාල" දහමට නැඹුරුකරවා ගැනීමට මහත් වෙහෙසක් දැරීම.
(4) බුදු රදුන්ට උපස්ථාන කිරීම සඳහා දිනකට තෙවතාවක් දෙව්රම් වෙහෙරට යාම.
(5) දිනපතා තම නිවසින් භික්ෂූන් වහන්සේලා පන්සිය නමකට දන් පිළිගැන්වීම.

13. පහත දැක්වෙනුයේ ශාසනික තනතුරු කිහිපයකි.
**A** ධර්ම භාණ්ඩාගාරික තනතුර
**B** බහුශ්‍රැත භික්ෂූන් අතර අගතනතුර
**C** ස්මෘති සම්පන්න භික්ෂූන් අතර අගතනතුර
**D** අවබෝධ ශක්තිය ඇති භික්ෂූන් අතර අගතනතුර
**E** වීර්ය සම්පන්න භික්ෂූන් අතර අගතනතුර

මේවායින් ආනන්ද හිමිපාණන් වහන්සේට හිමි වූ තනතුරු ඇතුළත් වන්නේ,

(1) A, වල පමණි. (2) A, සහ B වල පමණි. (3) A, Bසහ C වල පමණි.

(4) A, B, C සහ D වල පමණි. (5) A, B, C,D, සහ E යන සියල්ලෙහි ය

14. "තමා හැර වෙනත් පුද්ගලයෙකුට හෝ තමා පාලනය කරන වෙනත් අදෘශ්‍යමාන බලවේගයක් කෙරෙහි විශ්වාසය නොතබා තමාගේ ගැළවුම්කරුවා තමාමය" යි සිතා ක්‍රියාකිරීමෙන් අදහස් වන්නේ,

(1) පුද්ගල ස්වාධීනත්වයයි. (2) පුද්ගල වගකිමයි. (3) පුද්ගල විස්වාසයයි.

(4) පුද්ගල ස්වාමිත්වයයි. (5) පුද්ගල ස්වච්ඡන්දතාවයි

15. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රය තුළින් ක්‍ෂත්‍රිය වර්ණයේ ප්‍රභවය හා විකාශය පිළිබඳ ව ද විවරණයක් සිදුකරනු ලබයි. එම විවරණයට අදාළ නොවන වරණය තෝරන්න.

(1) කෙත්වලට අධිපති වූ බැවින් පාලකයා ක්‍ෂත්‍රිය නම් වේ.

(2) පාලකයා රාජා නාමයෙන් හඳුන්වන්නේ මහජනයාගේ කැමැත්තෙන් පත්කරගත් බැවිනි.

(3 සමාජ සංස්ථාවන් අතරින් පළමුවෙන් විස්තර වන්නේ ක්‍ෂත්‍රිය වර්ණය පිළිබඳවයි.

(4) පාලකයා වෙත ඇති බලය ජනතාව විසින් ලබා දෙන ලද්දකි.

(5) සමාජගත දුරාචාර පාලනය කරගැනීම සඳහා පාලකයෙක් පත්කර ගන්නා ලදී.

16. රාජ්‍ය පාලකයාගේ ප්‍රධාන යුතුකම වන්නේ තම රටවැසියාගේ සුභ සිද්ධිය උදෙසා කටයුතු කිරීමයි. ඒ සඳහා සෑම පාලකයෙක් ම පාහේ විවිධ සැලසුම්, ප්‍රතිපත්ති මත පිහිටා ක්‍රියාත්මකවේ. බුදුදහම මිනිසාගේ පමණක් නොව තිරිසන් ගත සතුන්ගේ ජීවිත සුරක්‍ෂිතතාව කෙරෙහිද සැලකිලිමත් වී ඇත. එයට අදාළ බෞද්ධ ඉගැන්වීමක් දැක ගත හැකිවන්නේ .

(1) දසරාජ ධර්ම තුළිනි (2) සතර සංග්‍රහ වස්තු තුළිනි (3) සප්ත අපරිහානීය ධර්ම තුළිනි

(4) දස සක්විතිවත් තුළිනි (5) සතර බ්‍රහ්ම විහරන තුළිනි

17 දීඝ නිකායේ චක්කවත්තසීහනාද සූත්‍රය තුළින් සමාජය තුළ ක්‍රමයෙන් අසද් ධර්ම ඇතිවීමට හේතුවත් ඇති වූ අසද් ධර්මයනුත් හේතුඵල සම්බන්ධතාවෙන් යුතු ව ඉදිරිපත් කර ඇත. ඒවා අපිළිවෙළින් පහත දැක්වේ.

A - බොරුකීම B - ප්‍රාණඝාතය C - අවි ආයුධ භාවිතය

D - දිළිඳුකම E - සොරකම

මෙම කරුණු සූත්‍රයට අනුරූපී ව පිළිවෙළින් පෙළගැස්වූ වරණය තෝරන්න.

(1) A, B,C D, E, ය. (2) D,E,C,B,A ය. (3) C, B, A,D,E ය.

(4) B, C,A,E,D ය. (5) B,A,E,C, D ය.

18. බෞද්ධ ඉගැන්වීම් අනුව හොඳ නරක විනිශ්චය පිණිස වඩාත් නිවැරදි නිර්ණායකය ලෙස සැලකිය හැක්කේ,

(1) ස්වාධීන චින්තනයට හා හෘදය සාක්ෂියට අනුරූප වන දේ නිවැරදියැයි පිළිගැනීමයි.

(2) පිටක ග්‍රන්ථ වල දැක්වෙන විවරණ නිවැරදියැයි පිළිගැනීමයි.

(3) ගුරුවරයා ඉගැන්වූ දේ නිවැරදියැයි පිළිගැනීමයි.

(4) තමන්ගේ න්‍යායට තර්කයට අනුරූප වන දේ නිවැරදියැයි පිළිගැනීමයි.

(5) පරම්පරාගතව පැවැත එන අදහස් නිවැරදියැයි පිළිගැනීමයි.

19. පහත සඳහන් ප්‍රකාශන අතරින් ශ්‍රද්ධාව පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) ශ්‍රද්ධාව ආකාරවතී හා අමූලිකා වශයෙන් දෙයාකාර වේ

(2) තෙරුවන් පිළිබඳව ඇති කරගන්නා වූ පැහැදීම ආකාරවතී ශ්‍රද්ධාව නම්වේ.

(3) ආකාරවතී ශ්‍රද්ධාව බුද්ධි ගෝචර වූවකි.

(4) ශ්‍රද්ධාවන්තයා සිල්වතුන් දැකීමට කැමැත්තක් දක්වයි.

(5) අමූලිකා ශ්‍රද්ධාව ප්‍රඥාවෙන් තොරවූවක් නොවේ.

20. පහත සඳහන් ශික්ෂාපද අතරින් උපෝසථ අෂ්ටාංග සීලයට අයත්වන්නේ,

(1) පිසුණාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.
(2) කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.
(3) නච්චගීතවාදිත විසූක දස්සනා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.
(4) මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.
(5) මාලාගන්ධ විලේපන ධාරනමණ්ඩන විභූසණට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.

21. සිරිදාස සතුන්ට උගුල් අටවා සතුන් මරා එම මස් විකුණා උපයන මුදල් හා සොරකමින් උපයන මුදල් මත්ද්‍රව්‍ය භාවිතයට හා සුදුවට යොදවයි. එපමණක් නො ව අනුන්ගේ පවුල් ජීවිතවලට බලපෑම් ඇතිවන ආකාරයට කේලම් කියමින් පරදාර සේවනයෙහි යෙදෙමින් ගමේ කඩපිල්වල කාලය ගත කරමින් මිථ්‍යා මත ඉදිරිපත් කරන පව්වු මිනිසෙකි. සිරිදාසගේ මේ චර්යා රටාවෙහි දස අකුසලයන්ට අදාළ ක්‍රියාකාරකම් ගණනාවක් දක්නට ලැබේ. එම අකුසල සංඛ්‍යාව කොපමණ ද?

(1) අටකි. (2) හතකි. (3) හයකි. (4) පහකි. (5) හතරකි.

22 බුද්ධ ශාසනයේ මුල්විසිවස තුළ නීති පැනවීමෙන් තොර ව ඕවාද ප්‍රාතිමෝක්ෂයෙන් භික්ෂූන් වහන්සේ මෙහෙයවීමට හැකිවුව ද පසුකාලයේ .......................... පහළවීමත් සමග නීතිපැනවීමේ අවශ්‍යතාවක් පැනනැගුණි. මෙහි හිස්තැනට අදාළ ශාසනික ව්‍යවහාරය පහත වර්ණයන්ගෙන් තෝරන්න.

(1) මිථ්‍යා දෘෂ්ටික ධර්ම (2) ආසවට්ඨනීය ධර්ම (3) අකුසල මූලයන්
(4) දුසිල් භික්ෂූන් (5) පාපකාරී සිතුවිලි

23. ගිහි බෞද්ධයා ආශාවන් පසුපස හඹායාම වෙනුවට ආශාවන් අඩුකර ගැනීමට කටයුතු කරයි. අතෘප්තිකර ස්වභාවය සමනය කර ගෙන තෘප්තිමත් සරල දිවිපෙවතකට හුරුවෙයි. මෙම ප්‍රකාශයෙන් කියවෙන්නේ,

(1) හිරි ඔතප් දෙක පිළිබඳවයි (2) සංතුට්ඨිතාව පිළිබඳවයි (3) අල්පේච්ඡතාව පිළිබඳවයි
(4) අල්පකෘත්‍යතාව පිළිබඳවයි (5) සුභරතාව පිළිබඳවයි

24. "සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය ප්‍රකට කෙරෙන විවිධ අවස්ථා බෞද්ධ මූලාශ්‍රයවලින් හඳුනාගත හැකි ය. ථෙර ථෙරී ගාථාවල දැක්වෙන විවරණයන් ද එයට එක් නිදසුනකි. සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය වන්නේ

(1) සුන්දරත්වය මත පදනම්ව ලබන ආශ්වාදයයි. (2) සොබාදහමේ අසිරිය දැකීමෙන් ලබන ආශ්වාදයයි.
(3) උපාදාන ග්‍රහණයෙන් තොර ව ලබන ආශ්වාදයයි. (4) පංචේන්ද්‍රයන් පිනවීමෙන් ලබන ආශ්වාදයයි.
(5) සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් දැකීමෙන් ලබන ආශ්වාදයයි.

25. ඇතැම් මිනිසුන් මිනිස්කමට පවා නිගාකරන අයුරින් සාහසික හා විවිධ කූට උපක්‍රම භාවිතා කරමින් ධනය ඉපයීමට පෙලඹේ. තුලාකූට, මානකූට, කංසකූට, උක්කෝටන යනුවෙන් දැක්වෙන්නේ එයින් කිහිපයකි. මෙහි සඳහන් **උක්කෝටන** යන්නෙන් අදහස් කෙරණුයේ,

(1) අල්ලස් ගැනීම් හා උපාය මගින් අනුන් රැවටීමයි.
(2) රන් නොවන දේ රන් ලෙසත් මැනික් නොවන දේ මැනික් ලෙසත් වංචා කිරීමයි.
(3) කෙත්වතු ආදිය මනින විට කෙත් හිමියාට අවාසි වන ලෙස මැනීමයි.
(4) තරාදියෙන් සිදුකරන කිරීම් ආදියෙන් සිදුකරන වංචාවන් ය.
(5) මැනීම් ආදිය සිදුකරනවිට සිදුකරන ලද වංචාවන් ය.

26. ධනය උපයන්නෙකු ළඟ තිබිය යුතු ලක්ෂණ පහක් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක් වේ. එම පහට අයත් නොවන්නේ මින් කුමක් ද?

(1) ධනෝපායන මාර්ගය කෙරෙහි දක්ෂ වීම (2) කර්මාන්තයන්හි ආදිනව දකිමින් ක්‍රියාකිරීම .
(3) කර්මාන්තය කෙරෙහි කම්මැලි නොවීම (4) කර්මාන්තය මනා ලෙස සංවිධානය කිරීම
(5) කර්මාන්තය පිළිබඳව නිසි පරිදි දැන ක්‍රියා කිරීමේ හැකියාව

27. ධන පරිහරණයේදී නොකා නොබී මිය යන අජද්ධුමාරික ක්‍රමයත්, දිඹුල් ගසේ අතු සොලවා දිඹුල් කඩා කන්නෙකු මෙන් ක්‍රියා කරන උදුම්බර ඛාදික ක්‍රමයත් බුදුදහමින් ප්‍රතික්ෂප කරයි. ඒ වෙනුවට ව්‍යග්ඝපජ්ජ සූත්‍රය තුළින් නිර්දේශිත ක්‍රියාවලිය වන්නේ,
(1) ආරක්ඛ සම්පදාවයි. (2) කල්‍යාණ මිත්තතාවයි. (3) සමජීවිකතාවයි.
(4) උට්ඨානසම්පදාවයි. (5) පඤ්ඤා සම්පදාවයි.

28. පහත දැක්වෙනුයේ කාමභෝගී ගිහියන් සැප ළඟා කරගන්නා ක්‍රම කිහිපයකි.
A භව භෝග සම්පත් බහුල ව රැස්කර ගැනීමෙන් සතුටු වේ.
B භෝග වගා කිරීමෙන් සතුටු වේ.
C දැහැමි ව භෝග සම්පත් උපයා ගැනීමෙන් සතුටු වේ.
D නිවැරදි ව දිවිපෙවතක් ගත කිරිමෙන් සතුටු වේ.
E තමාසතු සම්පත් දැහැමිව පරිභෝග කිරීමෙන් සතුටු වේ.
මෙම ප්‍රකාශන අතරින් අත්ථි සුඛ හා භෝග සුඛ සම්බන්ධ ව නිවැරදි ව සඳහන් ප්‍රකාශන ඇතුළත් වර්ණය වන්නේ,
(1) A සහ D වලය. (2) B සහ C වලය. (3) D සහ E වලය.
(4) C සහ E වලය. (5) C සහ D වලය.

29. කම්මැළි වූ කායික චෛතසික වීර්ය නැති කෙනෙකුගේ සියක් අවුරුදු ජීවිතයට වඩා දැඩි වීර්යයෙන් යුක්තවූවකුගේ එක දවසක ජීවත්වීම ඉතා උතුම් ය. යන මෙම අදහස ඇතුලත් ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ
(1) අත්තානං චේ පියං ජඤ්ඤා - රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං යන්නයි
(2) යෝ චේ වස්සසතං ජීවේ - කුසීතෝ හීන වීරියෝ යන්නයි
(3) න අත්ත හේතු න පරස්ස හේතු - න පුත්තමිච්ඡේ න ධනං න රට්ඨං යන්නයි
(4) අත්තනාව කතං පාපං - අත්තජං අත්තසම්භවං යන්නයි
(5) උට්ඨානවතො සතිමතො - සුචිකම්මස්ස නිසම්ම කාරිනෝ යන්නයි

30. පහත දැක්වෙනුයේ භෝග විනාශ මුඛ හයට අදාළ ආදීනවයන්ගෙන් කිහිපයකි.
A තමාගේ ආරක්ෂාව නැති වී යාම
B තම දේපළ වස්තුන්ගේ ආරක්ෂාව නැති වී යාම
C බලා සිටියදී ම ධනය විනාශ වේ
D බොහෝ දුක් කරදරවලට භාජනය වීම
E විවාහයට නුසුදුස්සෙක්වේ
F සමාජය ඔහුගේ වචනය නොපිළිගනී
මෙම ආදීනව අතරින් අවේලාවේ වීදි සංචාරයේ ආදීනව දැක්වෙනුයේ,
(1) B, C සහ E වල පමණි. (2) A, B සහ C, වල පමණි. (3) C, E සහ F වල පමණි.
(4) D, E, සහ F වල පමණි. (5) A, B සහ D වල පමණි.

31. මංගල සූත්‍රයේ ඇතුළත් **ආරති විරති පාපා** යන්නෙහි අර්ථය කුමක් ද?
(1) පාපයෙහි නො ඇලීම හා පවින් වැළකීමයි (2) පෙර කළ පින් ඇති බවයි
(3) සුදුස්සාට ගරු කිරීම යටහත් පැවැතුම් ඇති බවයි (4) කළ ගුණ දන්නාබවයි
(5) පව් කිරීමට ලජ්ජාව හා බියයි

32. පහත දැක්වෙනුයේ සිගාලෝවාද සූත්‍රයේ සදිසා නමස්කාරයට අදාළ යුතුකම්වලින් කිහිපයකි.
A. යහපත් කටයුතුවල යෙදවීම
B. පවින් වලකා ගැනීම.
C. මැනවින් හික්මවිය යුතු ය
D නිසි අධ්‍යාපන හා ශිල්පීය දැනුම ලබා දීම
E. උවදුරුවලින් වළක්වා ගතයුතු ය.
මෙම කරුණුවලින් නැගෙනහිර දිසාව නියෝජනය කරන දෙමව්පියන් විසින් දරුවන්ට ඉටුකළ යුතු යුතුකම්වලට අයත් වන්නේ
(1) A B D ය (2) A B C ය (3) B D E ය (4) B C D ය (5) C D E ය

33. බුදුරදුන්ගේ පළමු ලංකාගමන සිදුවූයේ ........................ පොහෝ දින මහියංගනයේ මහානාග වනෝද්‍යානයට ය.

(1) වෙසක් පුරපසළොස්වක (2) දුරුතු අවඅටවක (3) දුරුතු පුර අටවක (4). බක්මස පුර අටවක
(5) දුරුතු පුරපසළොස්වක .

34. ථෙරවාදී බුදුසමයේ චිරස්ථිතිය පිණිස ප්‍රථම ධර්ම සංගායනාවෙන් සුවිශේෂී කාර්යභාරයක් සිදුවිය. එකී කාර්යභාරයන් අතර ප්‍රමුඛ වන්නේ,

(1) ආනන්ද හිමියනට එල්ල වූ චෝදනාවලින් නිදහස්වීමට අවස්ථාව උදාවීම. .
(2) නොපැණ වූ නිති නොපැණවීමටත් පැනවූ නීති කඩනොකට ආරක්ෂා කිරීමටත් තීරණයවීම.
(3) ඡන්න හිමියනට බ්‍රහ්ම දණ්ඩය පැනවීමට තීරණයවීම
(4) සුභද්‍ර භික්ෂුවගේ අභද්‍ර වචනය ප්‍රතික්ෂේප කිරීමය.
(5) දුසිල් මහණුන් සසුනෙන් නෙරපීමය.

35. දෙවන ධර්ම සංගානාව සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) මහායාන බුදුදහමේ මූලාරම්භය සනිටුහන් වන්නේ දෙවන ධර්ම සංගායනාවෙන් අනතුරුව ය.
(2) විශාලා මහනුවර වාළුකාරාමයේදී මාස අටක් මුළුල්ලේ දෙවන සංගානාව පවත්වන ලදී.
(3) උබ්බාහිකාවේදී බටහිර දිසාව නියෝජනය කළේ සබ්බකාමී, සාළ්හ, ඛුජ්ජසෝභිත, වාසභගාමි යන හිමිවරුය.
. (4) දෙවන සංගායනාවේ මූලිකත්වය ගනු ලැබුවේ සබ්බකාමී මහ තෙරණුන් වහන්සේ විසිනි.
(5) විශාලා මහනුවරට වැඩි යස හිමියනට මුලින්ම දුනගැනීමට හැකි වුනේ ජාත රූප රජත කප්පයයි.

36. පහත සඳහන් වනුයේ කණිෂ්ක අධිරාජයා සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.

A.වසුමිත්‍ර හිමියන්ගේ ප්‍රධාන්වයෙන් සිව්වන ධර්ම සංගායනාව පවත්වන ලදී.
B.පුරුෂ පුරය කණිෂ්ක අධිරාජයාගේ රාජධානිය විය.
C.කණිෂ්ක අධිරාජයා වසර හතළිස් අටක් රාජ්‍ය විචාරණ ලදී.
D මධ්‍ය ආසියාවේ ධර්ම ප්‍රචාරක සේවාවක් ආරම්භ කිරීම.
E කණිෂ්ක අධිරාජයා නැළියක පමණ ධාතුතැන්පත්කොට විශාල ස්තූපයක් ගොඩනැංවීම.

ඉහත ප්‍රකාශන අතරින් වඩාත් නිවැරදි වන්නේ,

(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) B සහ D පමණි.
(4) A, C,D පමණි. (5) C, D,E පමණි

37. නාලන්දා විශ්වවිද්‍යාලයයේ තන්ත්‍රයාන බුදුසමය පිළිබඳ මහාචාර්ය ධුරය හෙබවූ කම්පාල තෙරණුවන් පළ කළ අදහසට ගරු කළ ක්‍රි.ව. 770 - 810 අතර රජ කළ ....................... විසින් වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ ප්‍රථම සංඝාරාමය ඉදි කරවන ලදී.

(1) ගුහසේන රජතුමා (2) සක්‍රාදිත්‍ය රජතුමා (3) කීර්තිපාල රජතුමා (4) ධර්මපාල රජතුමා
(5) බුද්ධගුප්ත රජතුමා

38. මහින්දාගමනයට පෙරාතුව පටන් ලක්දිව දේව වන්දනය පැවැති බව මහාවංශයේ සඳහන් සටහන්වලින් පැහැදිලිවේ. ඒ අනුව ලක්දිවට ම අධිපති දෙවියන් ලෙස සටහන් වනුයේ,

(1) පුරදේව (2) වෛශ්‍රවණ (3) විභිෂණ (4) සුමණ සමන් (5) උපුල්වන්

39. දුටු ගැමුණු රජතුමාට ....................... හිමියන් විසින් උපදේශකත්වය ලබාදෙන ලදී.

(1) කාල බුද්ධරක්ඛිත (2) ගෝධගත්තතිස්ස (3) කුපික්කල තිස්ස
(4) සංඝමිත්‍ර (5) කොහොන්තිස්ස

40 ඓතිහාසික මූලාශ්‍රයනට අනුව ක්‍රි. ව. පස්වන සියවසේ සිට බුරුමයේ බුදු සසුන සමෘධිමත් ව පැවැති බවට සාධක හමුවන ඉපැරණි නගර දෙක වනුයේ,

(1) ප්‍රෝම් සහ හිමවිෂා ය (2) පේගු සහ ථෙටෝන් ය (3) පොංටන් සහ පාපටෝන් ය
(4) නකොම් පටොම් හා පාපයෝම්ය (5) හංසවතී හා සුධම්මවතීය

41. ථායිලන්තයේ ථෙරවාදී බුදු සමයේ අභිවෘධිය සඳහා රාජ්‍ය මැදිහත්වීම ද තීරණාත්මක සාධකයක් බවට පත්ව ඇත. ඒ අනුව රාජ්‍ය මැදිහත්වීම පිළිබිඹු කෙරෙන අවස්ථා ගණනාවක් පහත සඳහන් වර්ණයන්හි දැකිය හැකිය. එම වරණයන් අතර සාවද්‍ය කරුණක් ඇති වර්ණය තෝරන්න.
   (1) බෞද්ධ විහාරාරාම පාලනය කිරීම රාජ්‍ය පාලනයට යටත්වේ.
   (2) විහාරස්ථානයන්හි ආගමික කටයුතු සඳහා අවශ්‍ය වියදම් රජය විසින් දරනු ලැබේ.
   (3) තාවකාලික පැවිද්ද සිදුකරන අවස්ථාවන්හි එහි මුලසුන හොබවන්නේ රටේ රජු විසිනි
   (4) රජයේ ප්‍රධානියා බෞද්ධයෙකු විය යුතුය.
   (5) බුදු දහම නඩත්තු කිරීම හා අරක්‍ෂා කිරීම රාජ්‍යයේ යුතුකමකි.

42. මාධ්‍යමික සම්පදායයේ ගුරුවරයා ලෙස සැලකෙන ...................... මහා පඥා පාරමිතා ශාස්ත්‍රය, ශත ශාස්ත්‍රය වැනි ඉතා වැදගත් ධර්ම ග්‍රන්ථ චීන බසට පරිවර්තනය කර බුදුදහම චීනයට හඳුන්වා දීමට ක්‍රියා කළ බව සඳහන් වේ.
   (1) කාශ්‍යප මාතංග හිමියන් විසින් (2) කුමාරජීව හිමියන් විසින් (3) ධර්මරක්‍ෂ හිමියන් විසින්
   (4) සංඝවර්මන් හිමියන් විසින් (5) සංඛපාල හිමියන් විසින්

43. පහත දැක්වෙනුයේ ජපානයේ සෙන් බුදු දහමේ ආභාසයෙන් ගොඩනැගුණ නිර්මාණ කිහිපයකි.
   A. සුමියේ B. හයිකු C. බුන්රකු D ඉකෙබනා E නෝ

   මෙම නිර්මාණයන්ට අදාළ දේශීය ව්‍යවහාරයන් නිවැරදිව පෙළ ගස්වා ඇති වරණය වන්නේ.
   (1) මල් සැකසුම් කලාව, නාට්‍ය කලාව, කාව්‍ය කලාව, චිත්‍රකලාව, රූකඩ කලාවයි
   (2) චිත්‍රකලාව, කාව්‍ය කලාව, මල් සැකසුම් කලාව, කාව්‍ය කලාව, රූකඩ කලාවයි
   (3) නාට්‍ය කලාව, චිත්‍රකලාව, කාව්‍ය කලාව, රූකඩ කලාව, මල් සැකසුම් කලාවයි
   (4) කාව්‍ය කලාව, රූකඩ කලාව, මල් සැකසුම් කලාව, නාට්‍ය කලාව, චිත්‍රකලාවයි
   (5) චිත්‍රකලාව, කාව්‍ය කලාව, රූකඩ කලාව, මල් සැකසුම් කලාව, නාට්‍ය කලාවයි

44. ජපානයේ හෙයියන්කියෝ යුගයේ ශාසන සංවර්ධනයට දායක වූ ප්‍රබල භික්‍ෂූන් වහන්සේලා දෙනමක් ලෙස සැලකෙනුයේ,
   (1) ග්යෝගී හා දෙන්ශ්යෝදයිෂි. භික්‍ෂූන් වහන්සේලා ය
   (2) රින්සයි හා දෝගෙන් භික්‍ෂූන් වහන්සේලා ය
   (3) බෝධි ධර්ම හා එකිදෝ භික්‍ෂූන් වහන්සේලා ය
   (4) දෙන්ශ්යෝදයිෂි හා කෝබෝදයිෂි භික්‍ෂූන් වහන්සේලා ය
   (5) දෝකුබන් හා උන්ෂෝ භික්‍ෂූන් වහන්සේලා ය

45. ...................... හමුවී ඇති හිටි පිළිමය .දනට ලංකාවෙන් හමු වී ඇති පැරණිම හිටි පිළිමය ලෙස සැලකේ.
   (1) මහඉළුක්පල්ලම ප්‍රදේශයෙන් (2) අව්කන ප්‍රදේශයෙන් (3) මාළිගාවිල ප්‍රදේශයෙන්
   (4) බුදුරුවගල ප්‍රදේශයෙන් (5) සැස්සේරුව ප්‍රදේශයෙන්

46. පහත දැක්වෙනුයේ ශ්‍රී ලාංකේය කලා නිර්මාණ පිළිබඳ ව විවිධ අදහස් ඉදිරිපත් කළ විද්වතුන් කිහිප දෙනෙකි.
   A. ආචාර්ය සෙනරත් පරණවිතාන B. ආචාර්ය සිරිගුණසිංහ C. මහාචාර්ය විනිවිතාරණ
   D. නන්දදේව විජේසේකර E. ඩී. ටී. දේවේන්ද්‍ර
   මේ අය අතරින් බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය මුලින් ම ශ්‍රී ලාංකේය නිර්මාණ ශිල්පීන් අතින් සිදුවූ බවට අදහස් ඉදිරිපත් කරන උගතුන් අතරට ගැනෙනුයේ,
   (1) A, B, හා C ය. (2) B, C, හා D ය. (3) B, D හා E ය. (4) A, C හා D ය
   (5) C, D හා E ය.

47. ස්තූපයක බඳ කොටස හෙවත් ගර්භයේ හැඩය අනුව ප්‍රධාන වශයෙන් ස්තූප ආකෘති හයක් පැරණි ශ්‍රී ලාංකික කලා ශිල්පීන් විසින් හඳුන්වා දී ඇත. ඒ අනුව පොළොන්නරුවේ දෙමළ මහා සෑය හා යුදඟණා ස්තූපය ආදිය අයත් වන්නේ,

(1) ඝටාකාර ආකෘතියට ය. (2) පද්මාකාර ආකෘතියට ය. (3) ධාන්‍යාකාර ආකෘතියට ය.
(4) ආමලකාකාර ආකෘතියට ය. (5) බුබ්බුලාකාර ආකෘතියට ය.

48. තිස්ස විද්‍යාලයේ බෞද්ධ ශිෂ්ටාචාරය විෂය උගන්වන රණවීර ගුරුතුමා තම සිසු සිසුවියන් සමග අනුරාධපුර ඉපැරණි අභයගිරි විහාරභූමියේ ඇති සුවිශේෂී නිර්මාණ පෙන්වීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක නිරතවිය. ඔහු රත්නප්‍රාසාදය නම් ගොඩනැගිල්ල සමීපයේ ඇති සුවිශේෂී කලානිර්මාණය පිළිබඳ ව කදිම විවරණයක් කරන ලදී. එම කලා නිර්මාණය කුමක්විය හැකිද?

(1) කොරවක්ගල නම් වූ කලා නිර්මාණයයි. (2) සඳකඩපහණ නම් වූ කලා නිර්මාණයයි.
(3) වාහල්කඩ නම් වූ කලා නිර්මාණයයි. (4) බෝධිඝරය නම් වූ කලා නිර්මාණයයි.
(5) මුරගල නම් වූ කලා නිර්මාණයයි.

49. ලාංකේය බෞද්ධ ගීත සාහිත්‍යය පෝෂණය කළ ගේය පද රචකයන් බුද්ධ චරිතය, බුදුදහම මෙන් ම ශාසන ඉතිහාසය ද වස්තුවිෂය බවට පත්කරගත් අවස්ථා දැකිය හැකි ය. ඒ අනුව පුද්ගලයාගේ සසර ගමන ඇතිකරවන පුද්ගල සිත් තුළ නිමක් නැතුව පවතින අසත් ධර්මයක් පිළිබඳව විවරණය කෙරෙන ගීතයකට උදාහරණයක් වන්නේ

(1) සිරිබුද්ධ ගයා විහාරේ .........
(2) අමා දහර දිය ගලා ගලා .........
(3) අඬවන් වූ දෙනෙතින් ගලනා .........
(4) සොරදෙටුවෙක් කස තැලුම් කකා .........
(5) පාරමිතා බල පූජිත පූජිත බුද්ධ දිවාකරයාණෝ .........

50. සෝලියස් මෙන්දිස් මහතාගේ විශිෂ්ට ගණයේ නිර්මාණ දැකගත හැකිවන්නේ කැලණි විහාරයේ අලුත් විහාර මන්දිරයෙන් වුවත් ඔහුගේ සෙසු නිර්මාණයන් ද ඇගයීමට ලක්කල හැකිවේ. ඔහුගේ සෙසු නිර්මාණයන් දැකිය හැකි ස්ථානයක් වන්නේ,

(1) මැද්දෙපොළ විහාරය (2) රිදී විහාරය (3) බෙල්ලන්විල විහාරය
(4) බොරැල්ලේ ගෝතමී විහාරය (5) කොළඹ මාලිගාකන්ද විහාරය

* * *

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය - 2023

බෞද්ධ ශිෂ්ටාචාරය 1 13 ශ්‍රේණිය m< ; re m ; h

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 5 | 26 | 2 |
| 02 | 1 | 27 | 3 |
| 03 | 3 | 28 | 4 |
| 04 | 2 | 29 | 2 |
| 05 | 4 | 30 | 5 |
| 06 | 5 | 31 | 1 |
| 07 | 4 | 32 | 1 |
| 08 | 1 | 33 | 5 |
| 09 | 1 | 34 | 2 |
| 10 | 3 | 35 | 3 |
| 11 | 3 | 36 | 3 |
| 12 | 2 | 37 | 4 |
| 13 | 5 | 38 | 5 |
| 14 | 4 | 39 | 2 |
| 15 | 2 | 40 | 1 |
| 16 | 4 | 41 | 3 |
| 17 | 2 | 42 | 2 |
| 18 | 1 | 43 | 5 |
| 19 | 5 | 44 | 4 |
| 20 | 4 | 45 | 1 |
| 21 | 4 | 46 | 3 |
| 22 | 2 | 47 | 2 |
| 23 | 3 | 48 | 5 |
| 24 | 3 | 49 | 4 |
| 25 | 1 | 50 | 1 |

II පත්‍රය පිළිතුරු

(i) වානප්‍රස්ථ ආශ්‍රමයට අයත් කාර්යයන් හතරක් නම් කරන්න.
- තවුස්දම් රැකීම සඳහා වනගතවීම
- දරු මුණුපුරන් ලැබීමෙන් පසු භාර්යාව සමග හෝ හුදකලාව වනගතවීම
- කාමභෝගී ජීවිතයෙන් සම්පූර්ණයෙන් ම ඉවත්වීම
- වනයෙන් සොයාගන්නා ලද පලවැල ආහාරයට ගනිමින් හෝ පිඬු සිගායාමෙන් යැපීම
- හෝම ගින්න නොනිමා පවත්වාගෙන යාම
- ආගමික අංශයට නැඹුරුව ආත්මය මුදවා ගැනීමට කටයුතු කිරීම (ලකුණු 2යි)

(ii) බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ **තුනක්** පෙන්වා දෙන්න.
- සත්ත්වයා හා ලෝකය පිළිබඳ ඊශ්වර නිර්මාණවාදය පිළිගත් බව.
- ඒ අනුව මහබ්‍රහ්ම, මහා පුරුෂ සංකල්පය හා එය පදනම් කොට ගෙන නිර්මාණය කරන ලද වර්ණාශ්‍රම ධර්ම ආදිය දිව්‍යමය ප්‍රභවයක් ලෙස දැක්වූ බව.
- වේද ග්‍රන්ථ පරම සත්‍ය ලෙස පිළිගත් බව.

- යාගය, පුදසත්කාර, ගීතිකා ගායනය ආදිය මුල්කරගත් කර්ම මාර්ගය ලෞකික ලෝකෝත්තර සැප පිණිස ඒකායන මාර්ගය ලෙස පිළිගත් බව.
- අගාරික ප්‍රතිපදාව පිළිගත් බව.
- පුද්ගල ස්වච්ඡන්දතාව, ස්වාධීනත්වය දේව නිර්මාණවාදයට යටපත් කළ බව.
- ජන්මීය සාධක මත පුද්ගලයා උසස් හා පහත් යනුවෙන් තීරණය වූ බව.
- කාන්තාවගේ දේශපාලන, ආර්ථික, සාමාජික, ආගමික නිදහස අහුරා තැබූ බව. (ලකුණු 3යි)

(iii) බුදු සමය මානව සංහතියේ ඒකත්වය සනාථ කිරීමට ඉදිරිපත්කරන ඉගැන්වීම් **හතරක්** මූලශ්‍රයාගතව ඉදිරිපත් කරන්න.

- අම්බට්ඨ බ්‍රාහ්මණයාගේ සත්මුතු පරම්පරාවෙහි ආදි සත් වැන්නා ක්ෂත්‍රිය වංශිකයෙකුගේ නිවසෙහි බැළ මෙහෙවරකම් කළ ශුද්‍ර කාන්තාවක විසින් බිහි කරන ලද අයකු බව දැක්වීමෙන් පසු ව ඉතිහාසයෙහි කිසිදු වර්ණයක් අමිශ්‍ර ව නො පවත්නා බවට කරුණු පැහැදිලි කරනු ලැබී ය.
- ඉතිහාසය තුළ චතුර්වර්ණයන් බිහිවීමට හේතු අයුරු අග්ගඤ්ඤ සූත්‍රයෙහි හේතුඵලවාදීව පිළිබිඹු වන බව
- වෘක්ෂ, තෘණ ආදියෙහි මෙන්ම පක්ෂීන් සිවුපාවන් උරගයන්, මත්ස්‍යයන් ආදි සත්ත්වයින් බෙදා දක්වන ලක්ෂණ ඇත. නමුත් මනුෂ්‍ය වර්ගයා වර්ගීකරණය කිරීමට ඉහත ආකාරයේ කිසිදු පදනමක් නොමැති බව වාසෙට්ඨ සූත්‍රය තුළින් තර්කානුකූල ව දක්වා ඇත.
- වර්ණ ධර්මය නිර්මාණකරුවකුගේ නිර්මාණයක් නම් සමස්ත මානව ප්‍රජාවටම පොදු විය යුතු ය. එය රටෙන් රටට හෝ සමාජයෙන් සමාජයට වෙනස් විය නොහැකි බව බෞද්ධ ඉගැන්වීමයි. නමුත් යෝන හා කාම්බෝජ යන ජනපදවල ආර්ය හා දාස වශයෙන් සමාජ කණ්ඩායම් දෙකක් දක්නට ලැබෙන බවත්, එය ද කලින් කලට වෙනස් වන බවත් අස්සලායන සූත්‍රය මගින් දක්වා ඇත.
- වසල සූත්‍රයේදී පුද්ගල හැසිරීමේ ස්වභාවය අනුව උස් පහත් බව හෝ පිරිසිදු අපිරිසිදු බව හෝ තීරණය වන අයුරු පැහැදිලි කොට දී ඇත.

(ලකුණු 4යි)

(iv) බුදුරදුන් දවස භාරතීය සමාජය වාණිජකරණයට ලක්ව පැවැති බව සාධක පහක් ඇසුරෙන් විස්තර කරන්න.

- භාණ්ඩ හුවමාරු ක්‍රමයෙන් ඈත්ව මුදල් භාවිතයට යොමුවීම(මස්ස, අඩමස්ස, කහවනුව)
- බැංකු කටයුතු පැවැතීම ( ණය දීම, ණය ගැනීම)
- වෙළඳ නගර නිර්මාණය වීම ( බරණැස, උදේනි,පාඨලී පුත්‍ර)
- විනෝදාස්වාදය ගෙනදෙන සැණකෙළි පැවැත්වීම (ගිරග්ග සමජ්ජ)
- සුරාසැල්, ගණිකා නිවාස, ඔට්ටුපොළවල් වාණිජ කරණයත් සමග ඇතිවීම
- මුදල් ඔට්ටුවට තබා සූදු ක්‍රීඩා පැවත්වීම
- භාෂාව, අදහස් උදහස්, ආහාරපාන, ඇඳුම් පැළඳුම්, ආදියෙහි වෙනස්කම් ඇතිවීම (රෝහිණී නදිය)
- දේශීයමාර්ග පද්ධති දියුණුවී ජාත්‍යන්තර මාර්ග හා බද්ධවීම (සේද මාවත)
- උසස් වංශිකයන්ගේ හා සිටුවරුන්ගේ දරුවන් තක්ෂිලා වැනි විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය ලැබීම
- ණගරය තුළ ඇති නැති පරතරය වැඩිවී ධනවතුන් මෙන්ම දුප්පතුන්ද සිටීම (ලකුණු 5යි)

(v) නිඝන්ඨනාථපුත්තතුමන්ගේ ඉගැන්වීම් බුදු දහමින් විචාරයට ලක්වන අයුරු විස්තර කරන්න.

- මොහුගේ මූලික ඉගැන්වීම්
  පුබ්බේකතහේතුවාදය, චතුයාම සංවරවාදය, කායදණ්ඩවාදය, ආත්මවාදය, පරම අවිහිංසාවාදය වශයෙන් දැක්විය හැකි බව
- මෙතුමන්ගේ ඉගැන්වීමට අනුව සියල්ල සිදුවන්නේ පෙර කරන ලද කර්මයට අනුවය යන සංකල්පය තුළින් කර්ම නියතියක් ලෙස සැලකෙන නමුදු බුදු දහම කර්මය නියතියක් ලෙස පිළිනොගනී.
- බුදු දහමට අනුව කර්මය වුව වෙනස් කිරීමේ හැකියාව පුද්ගලයාට ඇත. දිට්ඨධම්මවේදනීය, උපපච්ඡවේදනී, අපරාපරිය, අහෝසි යනුවෙන් කර්මය පිළිබඳ බෞද්ධ වර්ගීකරණය තුළින් එය පැහැදිලිවේ.

- බුදු දහමේ ඇතුලත් නියාම ධර්ම සංකල්පයට අනුව ද සියල්ල සිදුවන්නේ කර්මයට අනුරූපීව නොවන බව
- ජෛනයන්ගේ ත්‍රිදණ්ඩය අතරින් කාය දණ්ඩ ප්‍රධාන ලෙස සැලකුව ද බුදු දහමෙහිලා කර්මයේ ප්‍රධානත්වය මනසට හිමි වේ. බුදු දහමට අනුව සියලු ක්‍රියාවන් කර්ම නො වන අතර සිතාමතා කරන ක්‍රියා පමණක් කර්මය බවට පත්වේ
- බුදු දහම අවිහිංසාවාදය පිළිගත්ත ද පරම අවිහිංසාවාදය අගය නො කරයි.
- ජෛනයන්ගේ අත්තකිලමථානුයෝගය බුදු දහමේ මධ්‍යම ප්‍රතිපදාව මගින් ද බැහැර වේ.

(ලකුණු 6යි)

2. (i) බුදුරජාණන් වහන්සේ **"බුද්ධ"** නාමයෙන් හැඳින්වීමට හේතු වූ සාධක **දෙකක්** නම් කරන්න.
- සියලු සංඛත ධර්ම හා අසංඛත ධර්ම අවබෝධ කළේ ය, අවබෝධ කරයි, අවබෝධ කරන්නේ යන අර්ථයෙන් බුදු රජාණන් වහන්සේ 'බුද්ධ' යනුවෙන් හඳුන්වනු ලබන බව.
- දත යුතු සියල්ල අවබෝධ කළ බැවින් 'බුද්ධ' නම් වන බව
- චතුරාර්ය සත්‍යය තමන් වහන්සේ ම අවබෝධ කොට අන්‍යයන්ට ද අවබෝධ කරවන හෙයින් ද උන් වහන්සේ 'බුද්ධ' නම් වන බව
- ■ සියල්ල දන්නා බැවින් ද, සර්වඥ බැවින් ද, වෙනෙකකු විසින් අවබෝධ නො කරවිය යුතු නිසා ද, ක්ෂීණාශ්‍රව නිසා ද, වීතරාගී නිසා ද ආදි බොහෝ කරුණු නිසා 'බුද්ධ' නම් වන බව
- සිවු සස් සිය නැණින් - දන දන්වී ය කුලුණින්<br>දුරලයි අනුවණින් - එ බුදු නම් වී ය නැණ පමණින්

(ලකුණු 2යි)

(ii) බුදුරජාණන් වහන්සේගේ මහා කාරුණිකත්වය නිදසුන් **තුනක්** මගින් පැහැදිළි කරන්න
- අනුන්ගේ දුක දැක ගුණ හරිත හදවතක් ඇති අයකු තුළ ඇති වන දයානුකම්පාව කරුණාව බව.
- මුළු මහත් බුද්ධ චරිතය පුරාවට ම මෙම ගුණය පිළිබිඹු වන බව.
- සුනීත, සෝපාක, රජ්ජුමාලා, කිසාගෝතමී, මට්ටකුණ්ඩලී, පූතිගත්තතිස්ස තෙරුන්, හත්ථාලවක කුමරු, කෙත පාළු වූ ගොවියා, හදුවතිකා ඇතින්න ආදීන්ගේ කතා පුවත් මගින් මෙම ගුණය පිළිබිඹු වන බව. (ලකුණු 3යි)

(iii) ආදර්ශවත් ශ්‍රාවක සමාජයක් නිර්මාණය කරගැනීමෙහිලා තාදී බුදු ගුණය ඉවහල්වන අයුරු නිදසුන් **හතරක්** ඇසුරෙන් පෙන්වා පෙන්වා දෙන්න
- ලෝක ධර්මතා විෂයයෙහි කම්පා නොවී උපේක්ෂාවෙන් විඳදරා ගැනීමේ හැකියාව තාදී ගුණය බව.
- බුදුරදුන් මෙම ගුණය හොඳින් ප්‍රගුණ කර ඇති අයුරු කොසොල් මහරජතුමාගේ අසදෘශ මහා දානය මෙන් ම දුගී දුප්පත් දාසදාසීන් වෙතින් ලැබුණු රළු ආහාර දානය ද පිළිගැනීමෙන් ද සේල නැමැති බමුණු පඬිවරුන්ගෙන් ද කොසොල් ආදී මහ රජවරුන්ගෙන් ද අනේපිඬු වැනි සිටුවරුන්ගෙන් ද උපාලි වැනි ගෘහපතීන්ගෙන් ද දිව්‍ය බ්‍රහ්ම ආදි විවිධ පිරිස්වලින් ද ප්‍රශංසා මෙන් ම යසස ලැබුණ ද නොසැලුණු බව. අග්ගික භාරද්වාජ, අක්කෝසක භාරද්වාජ වැනි බ්‍රාහ්මණයන්ගෙන්ද මාගන්දිය, චිංචාමානවිකා, සුන්දරී පරිබ්‍රාජිකා, සුප්‍රබුද්ධ, දේවදත්ත වැන්නවුන්ගෙන් ද ආක්‍රොෂ් පරිභව, නින්දා සහ අයස ලැබුණ ද නොසැලුණු බව.
- පුද්ගල ජීවිතයකට ද මෙවන් අවස්ථාවන් ට අපමණවත් මුහුණදීමට සිදුවන බව තේරුම්ගෙන තම ජීවිතය පවත්වාගෙන යාමට ක්‍රියාකළයුතු බව අවධාරණය විය යුතුය. එවිට දුෂ්කර අවස්ථාවන්හිදී ඒවාට මුහුණ පෑමට සුදුවූ විට සිය දිවි නසා ගැනීමට හෝ වෙනත් අනර්ථකාරී ක්‍රියාකාරකම් වලට පුද්ගලයා නොපෙළඹෙන බව විස්තරවිය යුතුය.
- ඉවසීම, සංවර ව කටයුතු කිරීම, නොබියව කටයු කිරීම, යථාර්ථයෙන් පලානොයාම, උපේක්ෂා සහගතවීම, මානසික බිඳවැටීම වළක්වා ගැනීම වැනි ධනාත්මක ආකල්ප තාදී ගණය ප්‍රකට කිරිමෙන් සංවර්ධනය වන බව. (ලකුණු 4යි)

(iv) සැරියුත් තෙරුන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ **හතරක්** සැකවින් ඉදිරිපත් කරන්න
- නිවැරදි දේ හඳුනාගෙන ඒ අනුව කටයුතු කිරීමේ හැකියාව (ගිරග්ග සමජ්ජ වැනි උත්සවයන්හි පැවැති අනර්ථකාරී ස්වභාවය වටහා ගැනීම, සංජය පරිබ්‍රාජකගේ දර්ශනය යථාර්තය නොවන බව වටහා ගැනීම)

- සැබෑ කල්‍යාණ මිත්‍රයෙකු ලෙස කටයුතු කිරීම (කුඩාකළ පටන් සසුන්ගතවන තුරුත් ඉන් අනතුරුවත් මුගලන් හිමි සමඟ පැවැති ඇසුර, විශේෂයෙන් අස්සජි හිමියන්ගෙන් තමා අවබෝධකරගත් ධර්මය තම මිතුරාට කියා දී දෙදෙනාම සසුන්ගතවීම)
- තම ඥාති වර්ගයාට ද ශාසන ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කිරීම.
- මනා ඉවසීමෙන් යුක්තවීම (දිනක් පිඬු සිඟා වඩිද්දී මිසදුටු බමුණෙකු පැමිණ උන්වහන්සේගේ පිටට වැරෙන් පහරක් ගැසුව ද එයින් බිඳකුදු සිත සසල කර නොගැනීම. භාවනා කරමින් වැඩසිටින අවස්ථාවක රෞද්‍ර යක්ෂයෙක් මුඬුකර ඇති හිස දැක ඉතා වැරෙන් ටොක්කක් ඇනීම. ශාසනික තනතුරු නොලැබූ ජන්න තෙරුන් වැනි පිරිස් විසින් කරණු ලැබූ චෝදනා ඉවසීම)
- මනා ගුරු ගෞරවයෙන් යුක්ත වීම ( දිනකට තුන්වරක් අස්සජි මහරහතන් වහන්සේට නමස්කාර කිරීම, උන්වහන්සේ නොසිටි අවස්ථාවලදී උන්වහන්සේ වැඩසිටින දිසාවට නමස්කාර කිරීම)
- නිහතමානීවීම.(මිදුල අමදින විට සිවුරුපොට බිමගෑවෙන බව සාමණේර හිමි නමක් පෙන්වා දුන්විට එය පිලිගැනීම)
- ගිලානෝපස්ථානය ( කුෂ්ට රෝගයෙන් පෙළුණ සමිත ගුප්ත හිමියනට උපස්ථාන කිරීම) (ලකුණු 5යි)

(v) බුද්ධ කාලීන ධර්මදූතයන් වහන්සේලාගේ කාර්ය සාපල්‍ය ඇගයීමට ලක්කරන්න.

කොණ්ඩඤ්ඤ හිමි, අස්සජි හිමි, සැරියුත් හිමි, මුගලන් හිමි, සුනාපරන්තවාසී පුන්න හිමි, මහා කාශ්‍යප හිමි, මහාකච්චායන හිමි, පිණ්ඩෝල භාරද්වාජ හිමි වැනි ශ්‍රාවකයන් වහන්සේලා ධර්මප්‍රචාරක සේවාවේ නිරත වූ ආකාරය නිදසුන් මගින් පැහැදිළි කිරීම ප්‍රමාණවත්වේ. (ලකුණු 6යි)

3. (i) "සුකරානි අසාධූනි" යන ගාථාව සම්පූර්ණ කරන්න.

සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානිච
යං වේ හිතං ච සාධුං ච - තං වේ පරමදුක්කරං (ලකුණු 2යි)

(ii) එම ගාථාවේ අර්ථය නිවරැදිව ලියන්න.

තමාට අහිත වූ අයහපත් දේ ලෙහෙසියෙන් කරගත හැකි ය. යම් දෙයක් තමාට හිත හෝ යහපත් හෝ වේ නම් එය කිරීම ඒකාන්තයෙන් ඉතා අමාරු ය. (ලකුණු 3යි)

(iii) ස්වාමි සේවක සම්බන්ධතාවට අදාල යුතුකම් හා වගකීම් දහය සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න.

**ස්වාමිවරු හෙවත් සේව්‍යයන් විසින් කරුණු පහකින් සංග්‍රහ කළ යුතු බව පෙන්වා දෙයි.**

1. ඒ ඒ සේවකයාගේ ශක්ති ප්‍රමාණයට අනුව වැඩ කොටස් නියම කිරීම - යථාබලං කම්මන්ත සංවිධානේන
2. සුදුසු පරිදි ආහාර හා වැටුප් ලබාදීම - භත්තවේතනානුප්පදානේන
3. ගිලන් වූ කල සෞඛ්‍ය පහසුකම් හා උපස්ථානාදිය සිදුකිරීම - ගිලානුපට්ඨානේන
4. මිහිරි ආහාරපානාදිය නිසිලෙස බෙදාදීම - අච්ඡරියානං රසානං සංවිභාගේන
5. සුදුසු අවස්ථාවන්හිදී නිවාඩු ලබාදීම - සමයේ වොස්සග්ගේන

**සේවකයා ස්වාමියා විෂයයෙහි පහත සඳහන් ආකාරයට කටයුතු කළ යුතුය.**

1. ස්වාමියාට පළමු ව අවදිවීම - පුබ්බුට්ඨායිනෝ
2. ස්වාමියාට පසු ව නින්දට යාම - පච්ඡානිපාතිනෝ
3. ස්වාමියා දුන් දෙය පමණක් ගැනීම - දින්නාදායිනෝ
4. වැඩ කටයුතු ඉතා හොඳින් කිරීම - සුකතකම්මකාරකා
5. ස්වාමියාගේ ගුණ වර්ණනා කිරීම - කිත්තිවණ්ණහරා (ලකුණු 4යි)

(iv) මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව සූත්‍රානුසාරයෙන් පැහැදිළි කරන්න.

1. බලා සිටියදී ම ධනය විනාශ වීම - සන්දිට්ඨිකා ධනජ්ජානි
2. කලකෝළාහල බහුල වීම - කලහප්පවඩ්ඪනී
3. විවිධ රෝගාබාධවලට ලක්වීම - රෝගානං ආයතනං
4. අපකීර්තියට භාජනය වීම - අකිත්ති සඤ්ජනනී
5. ලජ්ජාව නැතිවීම - කෝපීන නිද්ධංසනී
6. ප්‍රඥාව දුර්වල වීම - පඤ්ඤාය දුබ්බලීකරණී යන මෙම කරුණු හය පිළිබඳව පිළිබඳව සැළකිලිමත්වෙමින් පිළිතුර සකස්විය යුතුය. (ලකුණු 5යි)

(v) භාරතීය බෞද්ධ අධ්‍යාපනයේ විශිෂ්ඨත්වය වළභි විශ්ව විද්‍යාල තුලින් ප්‍රකට කෙරෙන බව සනාථ කරන්න.

- ක්‍රි. ව. 475 - 775 අතර විසූ මෛත්‍රික රජවරුන් ඉන්දියාවේ බටහිර ප්‍රාන්තයේ අගනුවර වූ වලභියෙහි ඉදි කළ මහා විහාරය පසුකාලයේ අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස ප්‍රචලිත වී අවසානයේ ශ්‍රාවකයාන බුදුසමයේ කේන්ද්‍රස්ථානය ලෙස වලභි විශ්වවිද්‍යාලය වශයෙන් ගෞරවාදරයට පාත්‍ර විය.
- හියුං සියැං තෙරුන්ගේ වාර්තා අනුව මෙම විශ්වවිද්‍යාලයයේ සංඝාරාම 100ක් (සීයක්) තිබූ අතර භික්ෂූන් වහන්සේලා 6000නමක් වැඩ වාසය කළ බව සඳහන් වේ.
- වලභි විශ්වවිද්‍යාලයයට දෙස් විදෙස් ශිෂ්‍යයන් බොහෝ පිරිසක් පැමිණ අධ්‍යාපනය ලැබූන යි ඉට්සිංගේ වාර්තාවේ සඳහන් වේ
- අතිවිශාල පුස්තකාලයයක් තිබූ මෙම විශ්වවිද්‍යාලයයට පුස්තකාලයයීය අරමුදලක් ද තිබූ බව ගුහසේන රජතුමා විසින් පිහිටුවන ලද සෙල්ලිපියක සඳහන් වේ
- පුළුල් විෂයමාලාවක් ක්‍රියාත්මක වූ මෙහි සම්මිතිය නිකායික ඉගැන්වීම්වලට ප්‍රධාන තැනක් හිමි වූ අතර පොදු වශයෙන් බුද්ධ ධර්මය තුලනාත්මක ව උගන්වා ඇත
- චතුර්වේදය, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් ආදි කොට ඇති හින්දු දර්ශන ඉගැන්වීම් ද හින්දු ධර්මශාස්ත්‍ර, දේශපාලන විද්‍යාව, වාණිජ විද්‍යාව සහ කෘෂිකර්මය, ආර්ථික විද්‍යාව, චිකිත්සා විද්‍යාව ආදි ලෞකික විෂයයන් ද උගන්වා ඇත
- වලභි විශ්වවිද්‍යාලයයේ උපාධිධාරීන් ඉගෙනුම් කටයුතුවලින් පසු ව ස්වකීය නිපුණත්වය, රාජ්‍ය සභා ඉදිරියේ දී ප්‍රදර්ශනය කළ වග ඉට්සිං වාර්තාවේ සඳහන් වේ
- වාද විවාද හා උත්සව අවස්ථාවන්හි දී මොවුන් සිය කුශලතා ප්‍රදර්ශනය කොට වලභි විශ්ව විද්‍යාලයයට කීර්තිය ලබා දීඇත
- නාලන්දා විශ්වවිද්‍යාලයයෙන් පෝෂණය වූ එහි ආදි ගුරුවරුන් වන සුප්‍රකට ගුණමතී හා ස්ථිරමතී යන පඬිවරුන් දෙදෙනා වලභි විශ්විද්‍යාලය ගොඩනැගූ නිසා නාලන්දා පරිපාලන රටාවට සමීප වූ පරිපාලන රටාවක් මෙහි පැවැතුනි
- අධ්‍යාපනය, පරිපාලනය, පරීක්ෂණ, පුස්තකාල ආදි සියලු කටයුතු නාලන්දාවට අනුරූප වන පරිදි මෙහි ක්‍රියාත්මක විය
- වලභි විශ්වවිද්‍යාලයය ප්‍රධාන හීනයාන අධ්‍යාපන මධ්‍යස්ථානය ලෙස කටයුතු කර ඇත (ලකුණු 6යි)

## `II කොටස

4. (i) බෞද්ධ දේශපාලන සංකල්ප මානව හිතවාදී පාලන තන්ත්‍රයක් ගොඩනගා ගැනීමට හේතු වන අයුරු විමසන්න.

කිසියම් රටක හෝ සමාජයක මිනිසාට කායික හා මානසික පීඩාකාරී බවින් තොරව දිවි ගෙවීමට හැකිනම් එය මානව හිතවාදී තත්තවයකි. එබඳු තත්ත්වයක් උදාකර ගැනීමට බෞද්ධ ඉගැන්වීම්වල ඇතුලත් පඤ්ච ශීලය, දසරාජ ධර්ම, දස සක්විති වත්, සප්ත අපරිහාණීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගති විරතිය, කූටදන්ත සූත්‍රාගත දේශපාලන ඉගැන්වීම් යන මෙම සංකල්පවල භාවිතයට ගතහැකි අයුරු නිදසුන් මගින් පැහැදිළි කිරීමක් මෙයින් අපේක්ෂා කෙරේ. (ලකුණු 10යි)

(ii) මෙලොව පරලොව උභයාර්ථ සාධනයට දස කුසල් උපකාරීවන අයුරු පෙන්වා දෙන්න.

- පුද්ගලයාගේත් සමාජයේත් උභයාර්ථය, යහපැවැත්ම, පාරිශුද්ධත්වය පිණිස විෂය වන්නා වූ බෞද්ධ ආචාර ධර්ම පද්ධතියක් වශයෙන් දස කුසල් සැලකෙන බව
- ප්‍රාණඝාතයෙන් වැළකීම මගින් නිර්භය සමාජීය පරිසරයක් නිර්මාණය වේ. අවි ආයුධ භාවිතයක් සිදු නො වේ. එවිට මිනී මැරුම්, සත්ත්ව ඝාතන ආදි වූ ලේ සෙලවීම් සිදු නො වේ. නිර්භය සමාජය තුළ කුඩා සත්ත්වයාගේ සිට විශාල සත්ත්වයා තෙක් සියලු ම සත්ත්වයින්ට බියෙන්, සැකෙන් ජීවත්වීමට සිදු නො වෙයි. එබඳු සමාජ පරිසරයක් සුවදායී ය; මිත්‍රශීලී ය; ප්‍රසන්නජනක ය. මේ තත්වය මෙලොව ජීවිතය සැපවත් කරගැනීමට මෙන්ම පරලොව ජීවිතය සැපවත් කරගැනීමට ද හේතුවේ.
- සොරකමින් මිදුණු තැනැත්තකු භාරගනුයේ කෙනෙකු දුන් දෙයක් පමණි. රුචිකත්වයක් දක්වනුයේ දුන් දෙයකට පමණි. එබැවින් එම තැනැත්තා සොර සිතින් තොර ව පිරිසිදු, ප්‍රසන්න සිතින් වාසය කරයි. මෙමගින් පුද්ගලයා අභ්‍යන්තරයෙන් ම අවංක වීමේ උත්තරීතර ගුණය ප්‍රගුණ කරගනියි. එවිට ලෝභය වැනි මනෝභාවයන් ද යටපත් වේ. එය පරලොව සුගතිය උදාකරගැනීමට හේතුවේ. මේ ආකාරයට සෙසු කුසල කර්මයන් ද හේතුවන බව විස්තරවිය යුතුය. (ලකුණු 10යි)

5. (i) පරිසර සංරක්ෂණයට අදාල බෞද්ධ ඉගැන්වීම් වත්මන් පරිසර ගැටලු අවම කරගැනීමට උපකාරීවන අයුරු පරීක්ෂා කරන්න.

- මිනිසා අවට ඇති වටපිටාව පරිසරය යි. එය ජීව හා අජීව වශයෙන් දෙයාකාර වන අතර, පුද්ගලයා මෙම දෙයාකාර පරිසරය කෙරෙහි ම හිතකාමී අයෙකු විය යුතු ය.
- මෙම දෙයාකාර පරිසරය ට ඇතුළත් අංශ ගණනාවකි. **වන සංරක්ෂණය ජල සංරක්ෂණය ශබ්ද** සංරක්ෂණ **භූමි සංරක්ෂණය සත්ත්ව සංරක්ෂණය වායු සංරක්ෂණය** එයින් කිහිපයකි.
- මෙයින් වන සංරක්ෂණය තුලින් ජීවය සඳහා අවශ්‍ය වාතය, ආහාර පාන, සෙවණ ආදිය ලබාදීම සිදු **වේ.**
- ගස් කැපීම නොකළ යුතු බවත්, කෙලෙස් වනය සිඳීම කළ යුතු බවත් ධම්ම පදයේ දැක්වේ.
- යමෙක් ගසක සෙවණෙහි හිඳින්නේ නම් හෝ නිදන්නේ නම් හෝ එහි අත්තක් නොසිඳින්නේ ය. මිත්‍රද්‍රෝහී බව ලාමක බව ප්‍රේත වත්ථුවේ දැක්වේ.
- ''වෘක්ෂලතා සිඳීම හෝ සිඳවීම, බිඳීම හෝ බිඳවීම, පිසීම හෝ පිසවීම පචිති ඇවැතක් වන බව භික්ඛු විභංගයේ දක්වා ඇත.''
- ගිලන් නොවූ මහණකු විසින් නිල් තණ මත මළමුත්‍ර හෝ කෙළ හෝ නොගැසිය යුතු බවත්, ඉඳුල් නොදැමිය යුතු බවත්, එසේ කරන්නාට ඇවැත් සිදුවන බවත් විනය පිටකයේ දැක්වේ.
- වනාන්තර ගිනි නොතැබිය යුතු බවත්, යමෙක් එසේ කරන්නේ නම් දුකුලා ඇවැතක් සිදුවන බවත් චුල්ලවග්ගපාළියේ දැක්වේ. මේ ආකාරයට සෙසු පාරිසරික අංශ පිලිබඳවද බුදු දහමෙහි ඇතුලත් ඉගැන්වීම් ගෙන හැර දක්වමින් ඒ තුළින් පරිසර හිතකාමී පුද්ගලයෙක් බිහිකර ගැනීමට හේතුවන අයුරු විස්තර විය යුතුය
- අවධිමත් සංවර්ධනය ද ඇතුළුව විවිධ සාධක පදනම්ව ගැටළු රැසක් නිර්මාණය වී ඇති අතර මාරාන්තික රෝගාබාධ ඇතිවීමත් ඕසෝන් ස්ථරයට හානි පැමිනවීම නිසා පරිසර උෂ්ණත්වය වැඩිවීම තවත් බොහෝ ගැටළු ඇතිවීමට හේතු වී ඇත. (ලකුණු 10යි)

(ii) රටක ආර්ථික හා සමාජීය ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේදී ධනෝපායානය හා ධනපරිහරණයට අදාල බෞද්ධ ඉගැන්වීම්වල පවත්නා වැදගත්කම ඇගයීමට ලක්කරන්න.

- ආර්ථික පරිහානීය සමාජය තුළ සමාජ ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතුවනබව චක්කවත්තිසීහනාද සූත්‍රයේ සඳහන් අධනානං ධනේ අනනුප්පාදියමානේ ..... යන්නෙන් පැහැදිළිවේ.
- එබැවින් රටකට හෝ පුද්ගලයෙකුට නිසි ධනෝපායන මාර්ගයක් පැවැතිය යුතුය. බුදු දහමේ සඳහන් ධනෝපායන මාර්ග සමාජය තුළ අතුරු ප්‍රශ්ණ නිර්මාණය නොකරන ඒවා බැවින් ඒවා ක්‍රියාත්මක කිරීමට පෙළඹිය යුතුය.
- ව්‍යග්ගපජ්ජ, සිගාලෝවාද, පත්තකම්ම, අනණ, වණිජ්ජා ආදී වශයෙන් සූත්‍ර රැසක ධනෝපායන මාර්ග හා ඒවා සාධාරණව කළ යුතු ආකාරය පිළිබඳව තොරතුරු විස්තරවන බව දැක්විය යුතුය.

- සිගාලෝවාද සූත්‍රයේ ධනය කොටස් හතරකට බෙදා පරිහරණය කළයුතු ආකාරය පිළිබඳවත් ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ සමජීවිකතාව මගිනුත් රාසිය සූත්‍රයේ අගථිතෝ, අමුජ්ජිතෝ යනාදී වශයෙන් දක්වෙන ක්‍රම වලින් බැහැරව ධනය පරිහරණයට යොමුවීමෙන් උක්ත පශ්ණවලට පිළිතුරු සැපයෙන බව විස්තරවිය යුතුය. (ලකුණු 10යි)

6. (i) පළමු ධර්ම සංගායනාවට පදනම් වූ කරුණු සැකවින් දක්වා ශාසන චිරස්ථිතියට එහි ප්‍රතිඵල හේතු වූ අයුරු පැහැදිළි කරන්න.
   - සුභද්‍ර භික්ෂුවගේ ප්‍රකාශය, විසිරී පැවති ධර්මය ඒකරාශිකර ගැනීමේ අවශ්‍යතාව හා ජීවමාන බුද්ධ කාලයේ පටන් සසුන තුළ ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැවැති අනෙකුත් තත්වයන් ප්‍රථම ධර්ම සංගායනාවට බලපෑ බව විස්තර විය යුතුය.
   - ශාසන චිරස්ථිතියට අදාල තීරණ ගණනාවක් මෙම සංගායනාවේදී ගනු ලැබූ බව විස්තරවිය යුතුය. ඒ අතර
   - ධර්ම විනය ඒකරාශී කොට ගැටළු නිරාකරණය කරමින් විනය ග්‍රන්ථ පහක් ලෙස සහ ධර්මය නිකාය ග්‍රන්ථ පහක් ලෙස සංග්‍රහ කිරීම, භානක පරම්පරාවන් ඇති කිරීම, බුද්ධ නියමන් බුද්ධානු ධුද්ධක ශික්ෂාපදයන් නොසලකා හැර ක්‍රියත්මක කිරීමට තීරණය වීම
   - ඡන්න හිමියනට බ්‍රහ්ම දණ්ඩය පැනවීම ආදී කරුණු ඇතුලත් පිලිතුරක් මෙයින් අපේක්ෂා කෙරේ (ලකුණු 10යි)

   (ii) ධර්මාශෝක අධිරාජයා බුදු සසුනේ උන්නතිය උදෙසා ගත් ක්‍රියාමාර්ග විමසීමට ලක් කරන්න.
   - සැටදහසක් මිසදුටු හා දුසිල් මහණුන් තෝරාගෙන සසුනෙන් බැහැර කොට ශාසන සංශෝධනයක් සිදුකිරීමට සහභාගිවීම
   - තෙවන ධර්මසංගායනාවට රාජ්‍ය අනුග්‍රහය දැක්වීම.
   - ප්‍රධාන රටවල් නවයකට ධර්මදූතයන් වහන්සේලා පිටත්කර හැරීම
   - සාංචි ස්තූපය ඇතුළු අසූ හාරදහසක් වෙහෙර විහාර ඉදිකිරීම
   - සෙල්ලිපි, පුවරුලිපි. ටැම්ලිපි ආදිය මගින් බුදු දහමේ ඉලැන්වීම් ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම
   - ධර්ම මහාමාත්‍රවරුන් පත්කිරීම හා ආගමික සහනශීලිත්වයෙන් කටයුතු කිරීම.
   - තම දරුවන් දෙපොල සසුන්ගතකරවීම හා භික්ෂූන් වහන්සේලාට ප්‍රත්‍ය පහසුකම් සැපයීම
   - අශොක ධර්මය සඳහා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කරගනිමින් හය සමාජයට සම්ප්‍රේෂකිරීම
   - ලුම්බිණිය, බුද්ධගයාව, ඉසිපතන මිගදාය. කුසිනාරාව ආදී බුද්ධ චරිතය හා සම්බන්ධ පූජනීය ස්ථානවලට සංචාරය කොට ගල් ටැම් පිහිටුවා ඒවා ආරක්ෂා කිරීමට පියවර ගැනීම ලකුණු 10යි)

7. (i) ථායි සංස්කෘතිය පෝෂණය කිරීමට බුදු දහමින් ලැබුන දායකත්වය ඇගයීමට ලක්කරන්න.

බුදුදහම නඩත්තු කිරීම, ආරක්ෂා කිරීම රාජ්‍ය යුතුකමක් ලෙස සැලකෙන අතර රජයේ ප්‍රධානියා බෞද්ධයකු විය යුතු බව.

■ බෞද්ධ විහාරාරාම පාලනය කිරීම, රජයේ පාලනයට යටත් වන අතර විහාරස්ථානවල ආගමික කටයුතු සඳහා අවශ්‍ය සියලු වියදම් රජය විසින් දරන බව

■ ක්‍රමවත් සංඝ සංවිධානයක් පවතින අතර එහි ප්‍රධානයා රජය විසින් පත් කරන ලද සංඝ රාජයන් වහන්සේ නමක් වන බව

■ තායි පිරිමින් ටික කලකට හෝ පැවිදි වී සිටීම චිරාගත සම්ප්‍රදායයක් වන අතර පැවිදි වීම හා උපැවිදි වීම උත්වශ්‍රීයෙන් සිදුවන බව ද, එම තාවකාලික පැවිද්දේ දී හමුවන සහතිකය විවාහ වීමේ දී හා රැකියා ලැබීමේ දී විශේෂ සුදුසුකමක් සේ සලකන බව ද සඳහන් වන බව

■ මනා ගිහිපැවිදි සම්බන්ධතාවක් පවතින අතර තායි භික්ෂූන් වහන්සේගේ ශිෂ්‍යයන් තුළ ආධ්‍යාත්මික අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන අතර ම ලෞකික ජීවිත ගැටලුවලට ද විසඳුම් සැපයීම සිදු කරන බව

■ තායි ජනතාව දෛනික ව ආගමික කටයුතුවල නිරත වීමට අවශ්‍ය පූජාසනයක් කාමරයක සකස් කරගෙන එම පූජා කටයුතුවල නිරත වන බව

■ තායි රටේ ලොකු කුඩා සැම අයෙකුගේ ම ගෙලෙහි බුද්ධ රූපයක් පැලඳගෙන සිටීම සුලබ දසුනක් වන අතර එය සකස් කරනු ලබන්නේ භික්ෂූන් වහන්සේ විසින් බව

■ තායි විහාරස්ථානවල පැවිදි පිරිස් මෙන් ම බහුල ව ළමයින් ද වාසය කරන බව

- වාර්ෂික ව පැවැත්වෙන උත්සව අතර වෙසක් උත්සවය හා කඨින පූජෝත්සවය ප්‍රමුඛ තැනක් ගන්නා බවත් කඨින චීවරය ගෙන යන පෙරහැර ජාතික ක්‍රීඩාවලින් සමන්විත වන බවත් තායි රජතුමා කිසියම් විහාරයක කඨින පිනකමට සහභාගි වීම අනිවාර්ය බවත් දැක්වෙන බව
- අධ්‍යාපනය කලා ශිල්ප හා සාහිත්‍යය ද බුදු දහමින් පෝෂණය වී සංස්කෘතිය පෝෂණය කරලීමට දායකත්වයක් ලබා දී ඇති බව (ලකුණු 10යි)

(ii) අභයගිරි විහාරයේ ප්‍රභවය මෙරට ආගමික හා සංස්කෘතික පරිවර්ථනක් උදාකරලීමට ඉවහල් වූ අයුරු විමර්ශනය කරන්න.

**අභයගිරි විහාරයේ ආරම්භය**

- ක්‍රි. පූ. පළමු සියවස තෙක් මෙරට වාසය කළේ මහාවිහාරය මුල්කරගත් භික්ෂූන් වහන්සේලා ය.
- වට්ටගාමිණීඅභය රජු දෙවනවර බලයට පත්වීමෙන් අනතුරුව ගිරි නිඝණ්ඨාරාමය බිඳදමා එම ස්ථානයෙහි ගොඩනැගූ ආරාමය කුපික්කලතිස්ස හිමියන්ට පූජාකළ බව
- මෙය අභය විහාරය, අභයුත්තර විහාරය, උත්තර විහාරය නමින් ද හැඳින්වේ.

**ආගමික ප්‍රවනතා**

- පසු කාලයේදී අභයගිරිය වෙනම ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වූ බව
- පසුව ඉදිකළ සෝමාරාමය, දක්ඛිණගිරි විහාරය, සාලියාරාමය මෙයට ඇතුළත් විය.
- අභයගිරිය වජ්ජිපුත්තක නිකායට අයත් ධර්මරුචි හිමියන්ගේ අදහස් පිළිගෙන ක්‍රියාත්මක වූ බව
- වජ්ජිපුත්තක හා වෛතුල්‍යවාදී මත ඉදිරිපත් කරමින් මහායානික අදහස් ද අභයගිරිය හරහා ක්‍රියාත්මක වූ බව
- **සංස්කෘතික ප්‍රවණතා**
- නව දාර්ශනික සංකල්ප පිළිගැනීම හා නව මගකට යොමුවීම උදා: බෝධිසත්ත්ව සංකල්පය
- විවිධ පුද පූජා ආරම්භ කිරීම ජය පිරිත, සීවලී පිරිත, ගිනි පිරිත, ජලනන්දන පිරිත,දළදා පූජාව හා පෙරහැර ආරම්භ කිරීම
- අභයගිරි ස්තූපය ගොඩනැංවීම. මහායාන ධර්මය රන් පත්, තඹ පත් ආදියෙහි ලියා චෛත්‍යවල තැන්පත් කිරීම. ප්‍රතිපත්ති පූජාවට වඩා ආමිස පූජාවට මුල් තැනක් ලබාදීම
- භක්තිවාදය ප්‍රචලිත කිරීම තුළින් පූජා සංස්කෘතියක් ස්ථාපිත කිරීම., බෝධියට නහනුමුර පූජා පැවැත්වීම
- බෝධිසත්ත්ව ප්‍රතිමාවලට රාජාභරණ පැළඳවීම,බුද්ධ රූප අභිෂේක කිරීම
- කලාත්මක ක්ෂේත්‍රයේ වර්ධනයට කටයුතු කිරීම. අලංකාර ගෘහනිර්මාණ, මූර්ති, කැටයම්, පොකුණු ආදිය නිර්මාණය කිරීම උදා:- රත්නප්‍රාසාදය වැනි අලංකාර විහාර මන්දිර ඉදිකිරීම, සුවිශාල දානශාලා ඉදිවීම කලාත්මක බවින් අනූන බුද්ධ ප්‍රතිමා නිර්මාණය වීම අලංකාර සඳකඩපහණ, පොකුණු නිර්මාණය වීම (ලකුණු 10යි)

8. (i). භාරතීය බෞද්ධ ස්තූපයේ ප්‍රභවය පැහැදිළි කොට සාංචි ස්තූපයට සාපේක්ෂව ලාංකේය ස්තූපයේ වෙනස්කම් පෙන්වා දෙන්න.

- බුදුරජාණන් වහන්සේ මහා පරිනිබ්බාණ සූත්‍රයේ ස්තූප ගොඩ නැගීමට සුදුසු බුදු , පසේබුදු.මහරහත්හා සක්විති රජ යන පුද්ගලයින් දැක්වීම
- සැරියුත් මුගලන් අගසව් දෙනම වෙනුවෙන් හා මහා ප්‍රජාපතී ගෝතමිය වෙනුවෙන් බුද්ධ උපදේශය මත ස්තූප ඉදිකිරීම හා බුදුරදුන්ගෙන් බණ අසා රහත්ව සිටි බාහිය දාරුචිරිය මරණයට පත්වීමෙන් අනතුරුව එම දේහය අදාහනය කොට ස්තූපයක් කරවන ලෙසට බුදුරදුන් උපදෙස් ලබා දීම
- මහා පරිනිබ්බාණ සූත්‍රයේ සඳහන් ආකාරයට බුද්ධ පරිනිර්වාණය සිදුවීමෙන් අනතුරුව ශ්‍රී දේහය අදාහනය කොට ශාරීරික ධාතු තැන්පත්කොට සිව්මන්සලක ස්තූපයක් ඉදිකිරීමට උපදෙස් ලබා දීම
- අශෝක අධිරාජයාණන් විසින් ගොඩනගන ලද සාංචි ස්තූපය දැනට ඇති පැරණිම ස්තූපය ලෙස සැළෙකෙන අතර එයට අනුරූපීව ස්තූප ගොඩ නැංවීම සිදුවුව ද සාංචි ස්තූපයේ හා ලාංකේය ස්තූපයේ යම් යම් වෙනස්කම් දක්නට ලැබෙන බව

- **සාංචි ස්තූපයේ ලක්ෂණ**
- 1. සතර දිසාවට මුහුණලා තොරණ හතරක් දක්නට ලැබීම
  2. ස්තූපය වටා ප්‍රදක්ෂිණාපථයක් දක්නට ලැබෙන අතර එයට නැගීමට පියගැට පෙළක් දක්නට ලැබීම,
  3.ගර්භය මුදුනේ හර්මිකා නමින් හැඳින්වෙන ගල් ගරාදි වැටක් සහිත හතරැස් කොටුවක් විය
  4. හතරැස් කොටුව මත ශිලා ඡත්‍රය දර සිටි යෂ්ටිය (යූපය) පිහිටා ඇත.
  5. යූපය මත ඡත්‍රයක්
  6. ගර්භය අර්ධ ගෝලාකාර වීම

- **ලාංකේය ස්තූපයේ ලක්ෂණ**
  1. තුන් මහල් පේසාවළලු දක්නට ඇත එය ක්‍රමයෙන් කුඩාවන ආකාරයටය.
  2. මුල්කාලීන ලාංකේය ස්තූපවල ගර්භයට සම්බන්ධව ලීයෙන් කළ මුදුන් වැටක් තිබුණි.
  (මුද්ධවේදී) පසුකාලයේ එම නිර්මාණය අභාවයට ගොස් බදාම වලින් එය සංකේතවත් කර ඇත.
  3. මධ්‍ය යුගයේ හතරැස් කොටුව මත දේවතා කොටුව නමින් හැඳින්වුන නවාංගයක් එකතුවිය. එහි සතරවරම් දෙවිවරුන්ගේ රූප නිර්මාණය කිරීමක් දක්නට ලැබේ.
  4. මුල්කාලයේ ලංකාවේ ස්තූපවලද යූපය සවිකර තිබූ අතර පසු කාලයේ එය ඉවත් කර ඒ වෙනුවට කොත් කැරැල්ලයොදන ලදී.
  5. මුල්කාලීන ලංකාවේ ස්තූපවල එක් ඡත්‍රයක් පැවැති අතර පසුකාලයේ එය ඡත්‍රාවලියක් බවට පත්ව පසුව ඒ වෙනුවට කොත් කැරැල්ල සම්බන්ධ විය.
  6. කොතමත චූඩා මානික්‍යක් දක්නට දක්නට ලැබේ.
  7. ගර්භයේ හැඩය අනුව ස්තූප ප්‍රධාන අංග හයකින් යුක්තවීම (ලකුණු 10යි)

(ii). පහත සඳහන් මාතෘකා දෙකකට ප්‍රමාණවත් කෙටි සටහන් ලියන්න.

(1). සඳකඩ පහණ
- හෙළ කලාකරුවාගේ විශිෂ්ටතම නිමැවුම් අතර සඳකඩපහණට ප්‍රමුඛත්වයක් හිමි වේ. ඉන්දියාවේ **පාටිකා** නමින් හැඳින්වුණු සඳකඩපහණ ලංකාවේ **අඩ්ඪ චන්ද පාෂාණ, අඩසඳ පහණ, අඩ්ඪ චන්ද පදගන්ඨිකා යන නම්වලින්** ද හැඳින්වේ.
  එසේම,
- මුල් කාලයේ බෞද්ධ ගොඩනැගිලිවලට ප්‍රවේශ වීමට ඇති පියගැටපෙළ පාමුල තිබූ අර්ධ කවාකාර ගල් පඩිය සඳකඩපහණ නමින් හැඳින්වූ බව කියැවේ.
- ලාංකෙය් සඳකඩපහණ ආරම්භක වකවනුවේ කැටයම් විරල චාම් එකක් වූ අතර ක්‍රමයෙන් එයට කැටයම් එකතු වී ඇති බව
- බෞද්ධ ලෝකයේ විශිෂ්ටතම සඳකඩපහණ නිර්මාණය කිරීමේ ගෞරවය අනුරාධපුර යුගයේ මධ්‍ය භාගයේ සිටි කලාකරුවන්ට හිමි වන බව
- මෙම යුගයේ කලාත්මක බවින් අනූන සඳකඩපහණ කිහපිය අතරින් ප්‍රමුඛ වන්නේ බිසෝ මාලිගාව අසල පිහිටි සඳකඩපහණ බව
- ඊට අමතර ව මහසෙන් මන්දිරයෙහි ඇති සඳකඩපහණ, ථූපාරාමයට ආසන්නයේ දළදා මාලිගා ගොඩනැගිල්ලෙහි ඇති සඳකඩපහණ හා ශ්‍රී මහා බෝධියේ උතුරු ගෝපුරයේ ඇති සඳකඩපහණ ද කලාත්මක ඒවා බව
- අනුරාධපුර සඳකඩපහණට වඩා පොළොනන්රු යුගයෙ 'සඳකඩපහණ කරුණු කිහිපයකනී වෙනස් වන බව
- හින්දූන්ගේ පූජනීය සත්ත්වයා වශයෙන් සැලකෙන ගවයා ඉවත් වීමත් ඉතිරි සත්ත්වයන් අනුරාධපුරයේ මෙන් එක ම තීරුවක නොව වෙන වෙන ම තීරුවල කැටයම් කර තිබීමත් කැටයම් අනුපිළිවෙළෙහි වෙනස්කම් දක්නට ලැබීමත් ප්‍රධාන කරුණු බව
- උගතුන්ගේ මතයට අනුව මෙම සඳකඩපහණනෙහි ඇතුළත් කැටයම් හුදෙක් අලංකාරය සඳහා පමණක් නිමවන ලද ඒවා නොවන අතර ඉන් කිසියම් අරුතක් සන්නිවේදනය කෙරෙන බව

**(2). වාහල්කඩ**
- පැරණි ඉන්දීය දාගැබ් වටා සිවුදෙසින් ඉදි වූ තොරණ සතර වෙනුවට ලංකාවේ දාගැබ්වල ගර්භයට සම්බන්ධව සතර දිසාවට මුහුණ ලා තනා ඇති කලාත්මක නිර්මාණය වාහල්කඩ නමින් හැඳින්වේ.

- වර්තමානයේ වාහල්කඩ නමින් හැඳින්වෙන නිර්මාණ විශේෂය ශිලා ලේඛනවල සඳහන් වී ඇත්තේ **ආයක හා ආදිමුඛ** යනුවෙනි.
- පැරණි සිංහල කලාකරුවාගේ නිර්මාණ කෞශල්‍යය පිළිබිඹු කරන පැරණි කැටයම් රැසක් වාහල්කඩවල දක්නට ලැබෙන බව
- මිහින්තලේ කණ්ඨක චෛත්‍යයෙහි වාහල්කඩ කැටයම් උසස් කලාත්මක අගයකින් යුක්ත බව
- එහි උතුරු වාහල්කඩ සම්බන්ධ උතුරු දිසාවට අයත් ගල්කුලුනු දෙකෙහි හිස මත සිංහ රූපත්, දකුණු වාහල්කඩ කුලුනු හිසමත ගව රූපත්, නැගෙනහිර කුලුනු හිස මත ඇත් රූපත්, බටහිර කුලුනු හිස මත අශ්ව රූපත් දක්නට ලැබෙන බව
- ගල් කණුවල මුහුණත වර්ණ ගන්වන ලද විවිධ මල්කම් ද කළයකින් ඉහළට නගින කොළ සහිත දඬු ද දේව, මිනිස්, තිරිසන් හා පක්ෂි රූප ද දක්නට ලැබෙන බව
- මෙහි පවත්නා කල්ප වෘක්ෂ කැටයම අතිශයින් ම සිත්ගන්නා සුළු බව
- රුවන්මැලි සෑය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනය යන ස්තූපවල කැටයම්වලින් යුතු වාහල්කඩ පැවැති බව
- වාහල්කඩ සෑම ස්තූපයක ම අනිවාර්ය අංගයක් නොවූ බව

**(3). මහනුවර යුගයේ චිත්‍ර කලාව**

- මෙම යුගයේ සිතුවම් දක්නට ලැබෙන ස්ථාන වශයෙන් දෙගල් දොරුව විහාරය, මැදවල විහාරය, රන්ගිරි දඹුළු විහාරය, කුරුණෑගලට සමීප ව ඇති රිදී විහාරය, බඹරගල විහාරය කැලණියේ පැරණි විහාර මන්දිරය දැක්විය හැකිය.
- මේ යුගයේ සිටි චිත්‍ර ශිල්පීන් අතර දෙවරගම්පොළ සිල්වත් තැන, හිරියාලෙ නයිදෙ, දේවේන්ද්‍ර මූලාචාරියා යන අය විශේෂ වේ.
- රතු, සුදු, කහ, කළු යන වර්ණ වැඩි වශයෙනුත් නිල් සහ කොළ පාට අඩුවෙනුත් යොදාගෙන ඇත. කහ සහ සුදු පාටින් ඇඳි සිතුවම් රතු පසුබිමක දක්නට ලැබේ.
- අඛණ්ඩ කථන ක්‍රමයට සිතුවම් ඇඳීම මේ යුගයේ ජනප්‍රිය වී ඇත. එනම් කිසි යම් කතා පුවතක එක් චිත්‍ර රාමුවක් නොව ඒ හා සම්බන්ධ සිදුවීම් පෙළක් නිරූපණය කිරීමය.
- මිනිස් රූප,සත්ත්ව රූප හා ගස්වර්ග ස්වභාවික පරිසරයේ පවත්නා ආකාරයෙන් ම ඇඳීම මේ අයගේ සම්ප්‍රදාය නොවීය.
- අඳින ලද එම රූප සැබෑ මනුෂ්‍ය හා සත්ත්වයින්ගේ භෞතික ශරීයට අනුගත නොවේ. අඟපසඟ හා සරීර පරිමානුකූල නොවේ.
- එළිය අඳුර දැක්වීම හෝ පර්යාවලෝකය (ළඟ සහ ඈත වස්තු පෙනෙන ආකාරය) දැක්වීම ද සිදුකර නැත.

**(4). කව්සිළුමිණ**

- භාරතිය අලංකාර ශාස්ත්‍රය පදනම් කරගෙන නිර්මාණය වු සිංහලයේ විශිෂ්ටතම මහා කාව්‍ය කව්සිළුමිණයි.
- කුසදාකව ලෙසින් හැඳින්වුණු මෙය ''කව්සිළුමිණ'' ලෙස ප්‍රකට වූයේ හෙළ කව් ලොවේ වටිනාම කාව්‍යය වූ නිසාය.
- කතුවරයා දඹදෙණියේ රජ කළ දෙවැනි පැරකුම්බා නිරිඳුන්ය.
- මෙයට වස්තු විෂය වූයේ කුස ජාතකයයි.
- මේඝ දූතය වැනි සංස්කෘත මහා කාව්‍යයක අන්තර්ගත සර්ග බන්ධන ආදි කාව්‍ය රීතී භාවිතයට ගනිමින් ශෘංගාර රසය දනවන ලෙස රචනා වී ඇති මෙය සර්ග 15 කින් හා ගී 770 කින් යුක්ත වේ.



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න